# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,801 - 2013 මාර්තු 08 වැනි සිකුරාදා - 2013.03.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 672 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 727 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 734 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මාර්තු මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මාර්තු මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අංකය* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | | *අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|---|
| 01. | කාර්යාල සේවක සේවය<br>II පන්තිය | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600<br>(12 වන වැටුප් පියවර) | (i) | අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුය. |
| 02. | (1) කාර්යාල සේවක සේවය<br>III පන්තිය | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 | (ii) | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් 05 ශ්‍රේණිය/06 වසර සමත්විය යුතුය. |
| | (11) කාර්යාල සේවක සේවය<br>III පන්තිය | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 | (iii) | අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කරනු නොලැබේ. |
| 03. | රියැදුරු තනතුරු<br>II ආ පන්තිය | රු.12,470-10x130-10x145-10x160 -12x170 -රු.18,860 | (iv) | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත්විය යුතු ය. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කල නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.<br><br>අවම උස අඩි 05ක් විය යුතු ය. වාහන රියැදුරකු ලෙස වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය.<br>(සහතික මගින් සනාථ කළ යුතු ය.)<br><br>දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය. |
| 04. | ආදාහනාගාර ක්‍රියාකරු<br>අර්ධ ශිල්පීය<br>III ශ්‍රේණිය | රු.12,210-10x130-10x145-10x160 -12x170-රු18,600 | (v) | අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඃ<br>අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම සහ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)<br><br>බාහිර අයදුම්කරුවන් සඳහා ඃ<br>ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම සහ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කල යුතු ය.) |
| 05. | ආදාහනාගාර ක්‍රියාකරු<br>සහායක ශිල්පීය නොවන<br>III | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 | (vi) | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් 8 ශ්‍රේණිය/09 වසර සමත් විය යුතු ය. |

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
2. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.
3. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා අනුකූලව ක්‍රියා කිරීමට ද, සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

*බඳවා ගැනීම සඳහා පොදු තොරතුරු :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
2. අයදුම්කරු බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු අතර අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් එම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
4. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

1. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

2. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2013.03.22 වැනි දිනට පෙර ලැබෙනසේ "ලේකම්, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව, උඩුගම්පොල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

3. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතු ය.

4. තනතුරු කීපයක් සඳහා අයදුම්කරන්නේ නම් වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

5. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.

   (i) උප්පැන්න සහතිකය ;
   (ii) අධ්‍යාපන සහතික ;
   (iii) පදිංචිය තහවුරු කිරීම පිණිස මාස 03ක් ඇතුලත ලබාගත් ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
   (iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබාගත් එකක් විය යුතු ය.)

6. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අතරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඩබ්. එල්. පී. විජේසුන්දර,
ලේකම්,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 21 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත

**මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව**

............................................ ***තනතුර සඳහා වූ අයදුම්පත්‍රය***

1. (අ) මුලකුරු සමග නම :——————.
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

2. තැපැල් ලිපිනය :——————.

3. දුරකථන අංකය :——————.

4. හැඳුනුම්පත් අංකය :——————.

5. උපන් දිනය :
වර්ෂය :——————.මාසය :——————.දිනය :——————.

6. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ
අවුරුදු :——————.මාස :——————.දින :——————.

7. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

8. විවාහක/අවිවාහක බව :——————.

9. ජාතිය :——————.

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි කිරීමෙන් ද? යන වග :——————.

11. අධ්‍යාපන සුදුසුකම් :——————.

12. වෙනත් සුදුසුකම් :——————.

14. පලපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්:——————.

මෙම අයදුම්පතේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

03-556

---

## පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුවී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අදාළ අවම සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | රු. 12,210 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170- රු. 18,600 | අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත්වීම හා ආදාහනාගාර ක්‍රියාකාරිත්වය පිළිබඳ පුහුණුවක් ලබා තිබිය යුතු අතර ඒ පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතු ය. |
| 02 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 -12x 160- රු. 17,600 | අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත්වීම හා ආදාහනාගාර ක්‍රියාකාරිත්වය පිළිබඳ පුහුණුවක් ලබා තිබිය යුතු අතර ඒ පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතු ය. |
| 03 | යන්ත්‍ර ක්‍රියාකරු | 01 | රු. 12,210 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170- රු. 18,600 | අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඃ<br>(i) අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | (ii) බාහිර අයදුම්කරුවන් සඳහා : ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී කුමන හෝ විෂයයන් දෙකක් සමත්වී තිබීම.<br>*වෘත්තීය හෝ වෙනත් සුදුසුකම් :*<br>(i) බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32ට වඩා ගෙන යාමට බලපත්‍ර ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.<br>(ii) අවම උස අඩි 5 අඟල් 6ක් විය යුතු ය.<br>(iii) බඳවා ගැනීමට යෝජිත තනතුරට අදාළ (අංක 1 යටතේ සඳහන්) බර යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳව රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීනතාවයක් ලබා තිබීම. (පිළිගත් ආයතන වශයෙන් රජයේ ආයතනයක් පළාත් රාජ්‍ය ආයතනයක් අර්ධ රාජ්‍ය ආයතනයක් පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ.)<br>(iv) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතු ය. |
| 04 | මුරකරු | 02 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 -12x 160- රු. 17,600 | අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත්වීම. |
| 05 | සෞඛ්‍ය කම්කරු | 05 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 -12x 160- රු. 17,600 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 06 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 05 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 -12x 160- රු. 17,600 | අවම වශයෙන් 05 වන ශ්‍රේණිය සමත්ව තිබිය යුතු ය. |
| 07 | පුස්තකාල සහායක | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 -12x 160- රු. 17,600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් කවර හෝ විෂයයන් 06ක් සමත්වී තිබිය යුතු ය. |

*02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අය සඳහා උපරිම වයස් සීමාවක් බලපවත්වන්නේ නැත.)

(ii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(iii) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් සනාථ විය යුතු ය.)

(iv) පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි අයදුම්කරුවන් වෙනුවෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු ය.

(vii) රජයේ /පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු ය.

(viii) පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ix) අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(x) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 05ක සේවා කාලයක් තුළ පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(xi) පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන ආයතනයක රාජකාරි ආවරණය කරන්නේ නම් හෝ තනතුරට අදාල පළපුරුද්දක් හෝ පුහුණුවක් ලබා තිබේ නම් එය විශේෂ සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

03. *සේවා නියුක්ත කරලීමේ කොන්දේසි* :

(i) මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද රජය හෝ පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි සහ නියෝගවලට ද, අනුකූලව ක්‍රියා කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතු ය.
(iv) සේවයට බැඳුණු භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතු ය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව ලිඛිත වෘත්තීය හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

(ii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල්පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
5. වෘත්තීය හෝ පලපුරුද්ද තිබේ නම් එම සහතික ;
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් නම් අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*අයදුම්පත්‍ර එවීම* :

අයදුම්කරුවන් මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2013.03.18 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව, පාලින්දනුවර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය සතුවේ.

ඒ. එන්. පැලවත්ත,
ලේකම්,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

2013ක් වූ පෙබරවාරි මස 20 වැනි දින,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ....................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :——————.

මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

02. ස්ථිර පදිංචි ලිපිනය :——————.

03. ස්ථිර ලිපිනය :——————.

04. විවාහක/අවිවාහක බව :——————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :____________.

06. උපන් දිනය : අවුරුද්ද :——————. මාසය:——————. දිනය:——————.

07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද/ ලියාපදිංචි වීමෙන් ද ? :——————.

08. *අධ්‍යාපන සුදුසුකම් :*
අ.පො.ස. (සා.පෙළ) විභාගය .:————————.
සමත්වූ වර්ෂය හා විභාග අංකය :————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

*වෙනත් සුදුසුකම් :* ————————.

09. වෘත්තීය සුදුසුකම් : ————————.

10. සේවා පළපුරුද්ද : ————————.

(i) දැනට සේවය කරන ආයතනය : ————————.
(ii) දැනට දරන තනතුර : ————————.
(iii) එම තනතුරට පත්වූ දිනය: ————————.
(iv) පෙර සේවය කරන ස්ථානයේ දරන ලද තනතුර : ————————.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය : ————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ....................................... මයා/මිය/මෙනවිය මෙම ආයතනයේ ............................................... වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය මොන ආකාරයේ හෝ නිත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————.
ආයතන ප්‍රධානියා.

නම : ————————.
පදවි නාමය : ————————.
දෙපාර්තමේන්තුව/ආයතනය : ————————.

03-521

---

**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**

වයඹ පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

වයඹ පළාත් රාජ්‍ය සේවයේ කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති කරුවලගස්වැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක III වැනි පන්තිය | 01 | පී. එල්. 1-2006ඡ රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගනේ හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු වේ. |

| *අනු. අංකය* | *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 02 | මාර්ග කම්කරු III වැනි පන්තිය | 01 | පී. එල්. 1-2006 ඒ රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු වේ. |
| 03 | සෞඛ්‍ය කම්කරු III වැනි පන්තිය | 03 | පී. එල්. 1-2006ඒ රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය (09 වැනි වසර) සමත්ව තිබිය යුතු ය. |
| 04 | ජලනළ කාර්මික III වැනි පන්තිය | 01 | පී. එල්. 1-2006/ඒ රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගනේ හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු වේ. |
| 05 | රියදුරු III වැනි පන්තිය | 01 | පී. එල්. 3-2006/ඒ රු.12,470-10x130-10x145-10x160 -12x170-රු.18,860 | *(අ)* දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග විෂයයන් 06කින් (වෛකල්පිත විෂයයන් හැර) සමත්ව තිබිය යුතු ය. අවම වශයෙන් එක් වතාවක දී විෂයන් 05කින් වත් සමත්විය යුතුය.<br><br>දැනට ස්ථිර රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අනුමත පාසලකින් 08 ශ්‍රේණිය (9 වසර) සමත්වීම ප්‍රමාණවත් වේ.<br><br>*(ආ)* පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු ය.<br><br>*(ඇ)* රියැදුරු බලපත්‍රයක් ලබාගැනීමෙන් පසුව රියැදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු අතර සහතික මගින් සනාථ කල යුතුය.<br><br>*(ඈ)* අවම වශයෙන් උස අඩි 05ක් විය යුතු ය.<br><br>*(ඉ)* දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br><br>*(ඊ)* මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය. |
| 06 | විදුලි කාර්මික 111 වැනි පන්තිය | 01 | පී. එල්. 2-2006/ඒ රු.12,210-10x130-10x145-10x160 -12x170-රු.18,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු වේ. |
| 07 | නළ ලිං කාර්මික 111 වැනි පන්තිය | 01 | පී. එල්. 2-2006/ඒ රු.12,210-10x130-10x145-10x160 -12x170-රු.18,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු වේ. |

*02. බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :*

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
2. අයදුම්කරුවන් කරුවලගස්වැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක නියුක්ත අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවන් කරනු ලැබූවකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතු ය.
6. දැනටමත් කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කෙරේ.

*3. බඳවා ගැනීමේ ක්‍රමය :*

1. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම කරනු ලැබේ.

2. රියැදුරු තනතුර සඳහා බඳවාගනු ලැබීමට දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙක්, පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතු ය. ලිඛිත පරීක්ෂණයක් ද පවත්වනු ලබන අතර එම පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

*4. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. බඳවාගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ.
4. ප්‍රමාණවත් ඇපයක් මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් ගෙවන ලෙසට නියම කළහොත් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු වේ.
5. මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද, පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටී.
6. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*05. ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2013.03.30 වැනි දිනට පෙර ලේකම්, කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව, කරුවලගස්වැව යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස කෙළවර අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුවේ. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු වේ.) අයදුම්පත් ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*06. ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන :*

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුවේ :-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය ;
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතුය ;
5. සේවා සහතිකය (දැනට රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි).

දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතු ය.

එච්. එම්. චන්ද්‍රරත්න,
ලේකම්,
කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 12 වැනි දින,
කරුවලගස්වැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**

........................................ *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. *(අ)* මුලකුරු සමග නම :——————.
*(ආ)* සම්පූර්ණ නම :——————.
02. ලිපිනය :——————.
03. උපන් දිනය : අවුරුද්ද :——————. මාසය:——————. දිනය:——————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
05. විවාහක/අවිවාහක බව :——————.
06. ජාතිය :____________.
07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන්ද ? යන වග :——————.
08. අධ්‍යාපන සුදුසුකම් :——————.
09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද .:——————.
10. ඔබ දැනටමත් මෙම ආයතනයේ සේවය කරන්නේ නම් තනතුර හා සේවා කාලය : ——————.

(එම පත්වීමේ ස්වභාවය ෘ ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මත ද යන වග)

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරාගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

____________
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

03-423

---

**පානදුර ප්‍රාදේශීය සභාව**

පානදුර ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන සුදුසුකම්* | | *වෙනත් සුදුසුකම්* | *වැටුප් පරිමාණය* | *බඳවා ගැනීම* |
|---|---|---|---|---|---|---|---|
| | | | *අභ්‍යන්තර* | *බාහිර* | | | |
| 01 | ක්ෂේත්‍ර කම්කරු | 17 | අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය /6 වැනි වසර සමත් විය යුතු ය. | අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය /6 වැනි වසර සමත් විය යුතු ය. | | රු. 11,730 - 10x120 - 10 x130 - 10 x 145 - 12x 160 - රු. 17,600 | නියමිත සුදුසුකම් සපුරාලන අයදුම් කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ. |
| 02 | රියැදුරු II ආ | 01 | අවම වශයෙන් අටවැනි ශ්‍රේණිය /නවය වසර සමත් වීම | අවම වශයෙන් අටවැනි ශ්‍රේණිය /නවය වසර සමත් වීම | 1. තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳ මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු වීම හා මෝටර් රථ | රු. 12,470 - 10x130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් හා නිපුණත්වය මැනීමේ පරීක්ෂණයක් මගින් |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් - අභ්‍යන්තර | අධ්‍යාපන සුදුසුකම් - බාහිර | වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතු ය.<br>(2) අවම උස අඩි 05ක් විය යුතු ය.<br>(3) දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>4. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය. | | |
| 03 | විදුලි කාර්මික III | 02 | ජාතික පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක වරක දී සමත්ව තිබිය යුතු ය.<br>සහ<br>තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා ආයතන ප්‍රධානියා) විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. | ජාතික පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 2කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක වරකදී සමත්ව තිබිය යුතු ය.<br>සහ<br>තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා ආයතන ප්‍රධානියා) විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. | 1. වෘත්තියට අදාළව ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 3 වැනි මට්ටමේ සහතිකයක් ලබා තිබීම<br>හෝ<br>2. ජාතික තරුණ සේවා සභාවේ (NYSC) /කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DEET)/ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය/(VTA) /ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (NAITA) යන ආයතන මගින් වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් තිබීම හෝ | රු. 12,470 - 10x130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර | අධ්‍යාපන සුදුසුකම් බාහිර | වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | හෝ<br>3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් තිබීම. | | |
| 04 | කාර්යාල කාර්ය සහායක II | 01 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුය. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුය. | | රු. 11,730 - 10x120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | |

*02. බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(I) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
(II) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.
දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
(III) පානදුර ප්‍රාදේශීය සභාව තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.
(ඡන්දහිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුය.)
(IV) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය
(V) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
(VI) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු නොලැබූ අයෙකු විය යුතුය.
(VII) රජයේ පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබුවකු නොවිය යුතුය.
(VIII) පානදුර ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්/ආදේශ/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සේවකයින් සම්බන්ධයෙන් විශේෂයෙන් ප්‍රමුඛත්වය සලකා බලනු ලැබේ.
(IX) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී, බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවාගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම. පානදුර ප්‍රාදේශීය ලේකම් සතුය.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(I) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01ක පරිවාස කාලයකට යටත් වේ.
(II) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය
(III) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.
(IV) මෙම බඳවා ගැනීම් කොන්දේසි රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද/රජයේ මුදල් රෙගුලාසි වලටද/රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද බස්නාහිර පළාත් සභාව හෝ පානදුර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. *සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර පහත සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත් අමුණා එවිය යුතුය :*

(I) උප්පැන්න සහතිකය ;
(II) අධ්‍යාපන සහතික ;
(III) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ;
(IV) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය;
(V) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (මින් 01ක් ග්‍රාම නිලධාරියාගෙන් ලබාගත් එකක් විය යුතුය.);
(VI) පළපුරුද්ද පිළිබඳ සහතික;
(VII) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

05. වෘත්තීය තොරතුරු සමග සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් අයදුම්පතක් අදාළ සියලුම සහතිකවල පිටපත් ද සමගින්, 2013.03.21 දින හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

ලේකම්,
පානදුර ප්‍රාදේශීය සභාව,
පානදුර.

03-312

---

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

තනතුරු පුරප්පාඩු

පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | රියදුරු (III) | 02 |
| 02 | විදුලි කාර්මික(III) | 01 |
| 03 | ඖෂධ සංයෝජක (III) | 02 |
| 04 | ක්ෂේත්‍ර කම්කරු (III) | 05 |
| 05 | ජල කම්කරු (III) | 05 |
| 06 | සෞඛ්‍ය කම්කරු (III) | 11 |

01. *බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-*

I. *රියදුරු (III) ශ්‍රේණිය*

වැටුප් කාණ්ඩ - PL III - 2006A
වැටුප් පරිමාණය - රු. 12,470-10x130-10 x 145-10 x 160-12 x 170 - රු. 18,860 මාසික.

*පොදු සුදුසුකම් .-*

*(අ)* ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.
*(ආ)* අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් සභා රාජ්‍ය සේවයක නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
*(ඇ)* බඳවා ගැනීම අදාළ වන පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අඛණ්ඩව වසර 03ක පදිංචිකරුවෙකු විය යුතුයි.
සටහන .- පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස පළමුව අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමානව තෝරා ගැනීමට සුදුස්සන් ප්‍රමාණවත් නොවූ විටක, යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචිකරුවන් ගැන සලකා බැලේ.
*(ඈ)* යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර , කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තෙකු විය යුතු ය.

*අනෙකුත් සුදුසුකම්*

*අධ්‍යාපන සුදුසුකම් :-*

*(අ)* දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ)විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුයි.

*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*

(අ) අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතා පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කර ගෙන තිබිය යුතුයි ;

(ආ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 වැනි මට්ටමේ ( NVQ 4 ) හෝ කාර්මික අධ්‍යාපනය; හෝ

(ඇ) පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ( DTET ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම; හෝ

(ඈ) ජාතික තරුණ සේවා සභාවේ ( NYSC ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම; හෝ

(ඉ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ( VTA ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබී;ම හෝ

(ඊ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ ( NAITA ) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම; හෝ

(එ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකයක් ලබා තිබීම.

*පළපුරුද්ද :*

අදාළ තනතුරේ පළපුරුද්දක් ලබා තිබීම (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 02ක් වත් විය යුතු ය.)

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

* මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය;
* වැන්දඹු/පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතු ය.
* ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ බඳවා ගැනීම් සඳහා වන අනෙකුත් පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

*සාමාන්‍ය සේවා කොන්දේසි :*

* තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද පළාත් පාලන සේවා දෙපාර්තමේන්තු රෙගුලාසි වලට ද පාතහේවාහැට ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීතිරීතිවලට යටත් විය යුතුයි.
* දැනටමත් අනියම්/ආදේශක/තාවකාලික පදනමක් මත සේවයේ නියුක්තව සිටින අය ගැන ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.
* පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම්වලට යටත් වේ.
* නාගරික කොමසාරිස්, ලේකම් විසින් නියම කරනු ලැබුවහොත් බල ප්‍රදේශයේ පදිංචි විය යුතු ය.
* අවශ්‍ය වුවහොත් මුදලින් ඇපයක් තැබිය යුතු ය.
* මේ සම්බන්ධයෙන් කිසිම ලිපි ගනුදෙනුවක් නොකෙරෙන බව විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.
* සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්ත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතු ය.
* සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(II) විදුලි කාර්මික ( III )
(III) ඖෂධ සංයෝජක ( III )

*වැටුප් පරිමාණය :*

වැටුප් කාණ්ඩ - PL II - 2006A
වැටුප් පරිමාණය - රු. 12,210-10x130-10 x 145-10 x 160-12 x 170 - රු. 18,600 මාසික.

*පොදු සුදුසුකම් :*

(අ) ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.

(ආ) අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් සභා රාජ්‍ය සේවයක නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(ඇ) බඳවා ගැනීම අදාළ වන පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අඛණ්ඩව වසර 03ක පදිංචිකරුවෙකු විය යුතුයි.

සටහන .- පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස පළමුව අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමානව තෝරා ගැනීමට සුදුස්සන් ප්‍රමාණවත් නොවූ විටක, යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචිකරුවන් ගැන සලකා බැලේ.

*(ඇ)* යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තෙකු විය යුතු ය.

*අධ්‍යාපන සුදුසුකම් .-* දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුයි.

*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*

*(අ)* අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතා පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කර ගෙන තිබිය යුතුයි ;
*(ආ)* වෘත්තියට අදාළව ජාතික වෘත්තිය සුදුසුකම් 2 වැනි මට්ටමේ හෝ 3 වැනි මට්ටමේ ( NVQ 3 ) සහතිකය ලබා තිබීම ; හෝ
*(ඇ)* පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ( DTET ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම; හෝ

*(ඈ)* ජාතික තරුණ සේවා සභාවේ ( NYSC ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම; හෝ

*(ඉ)* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ( VTA ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම; හෝ

*(ඊ)* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ ( NAITA ) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම; හෝ

*(උ)* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකයක් ලබා තිබීම.

*පළපුරුද්ද :*

අදාළ තනතුරේ පළපුරුද්දක් ලබා තිබීම (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 02ක් වත් විය යුතු ය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

* මෙම තනතුර ස්ථිරය; විශ්‍රාම වැටුප් සහිතය.
* වැන්දඹු/පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතු ය.
* ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ බඳවා ගැනීම් සඳහා වන අනෙකුත් පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

*සාමාන්‍ය සේවා කොන්දේසි :*

* තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද පළාත් පාලන සේවා දෙපාර්තමේන්තු රෙගුලාසි වලට ද පාතහේවාහැට ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීති වලට හා එකී නීතිරීති වලට යටත් විය යුතුයි.
* දැනටමත් අනියම්/ආදේශක/තාවකාලික පදනමක් මත සේවයේ නියුක්තව සිටින අය ගැන ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.
* පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම්වලට යටත් වේ.
* අවශ්‍ය වුවහොත් මුදලින් ඇපයක් තැබිය යුතු ය.
* නාගරික කොමසාරිස්, ලේකම් විසින් නියම කරනු ලැබුවහොත් බල ප්‍රදේශයේ පදිංචි විය යුතු ය.
* මේ සම්බන්ධයෙන් කිසිම ලිපි ගනුදෙනුවක් නොකෙරෙන බව විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.
* සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්ත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතු ය.
* සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

IV *ක්ෂේත්‍ර කම්කරු/ජල කම්කරු/සෞඛ්‍ය කම්කරු*

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩ | - | PL - 2006A |
| වැටුප් පරිමාණය | - | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160 - රු. 17,600 මාසික. |

*බඳවා ගැනීමේ සුදුසුකම් :-*

*(අ)* ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.
*(ආ)* අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයක නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
*(ඇ)* බඳවා ගැනීම අදාළ වන පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.

සටහන .- පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස පළමුව අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමානව තෝරා ගැනීමට සුදුස්සන් ප්‍රමාණවත් නොවූ විටක, යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචිකරුවන් ගැන සලකා බැලේ.

*(ඇ)* යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තෙකු විය යුතු ය.

1. *අධ්‍යාපන සුදුසුකම් .-* දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සඳහා අවම වශයෙන් විෂයයන් හයකට සාමාර්ථ ලබා තිබිය යුතුයි.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

* තනතුර ස්ථිරය; විශ්‍රාම වැටුප් සහිතය.
* බඳවා ගනු ලබන්නන් රජයේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
* පත්වීම් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තමාගේ තනතුර ස්ථිර කළ බවට ලිපියක් තමා විසින් ලබා ගන්නා තුරු ආධුනික තත්ත්වයෙහි ලා සලකනු ලැබේ.
* තනතුරේ ස්වභාවය අනුව ආයතනය මගින් අනිකුත් සේවාවන්හි නියුක්ත කරවීමේ කොන්දේසි හා රාජකාරි වේලාවන් නියම කිරීම්වලට යටත් වේ.

*සාමාන්‍ය සේවා කොන්දේසි :*

* තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද පළාත් පාලන සේවා දෙපාර්තමේන්තු රෙගුලාසි වලට ද පාතහේවාහැට ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීති රීතිවලට යටත් විය යුතුයි.
* දැනටමත් අනියම්/ආදේශක/තාවකාලික පදනමක් මත සේවයේ නියුක්තව සිටින අය ගැන ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.
* පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම්වලට යටත් වේ.
* නාගරික කොමසාරිස්, ලේකම් විසින් නියම කරනු ලැබුවහොත් බල ප්‍රදේශයේ පදිංචි විය යුතු ය.
* අවශ්‍ය වුවහොත් මුදලින් ඇපයක් තැබිය යුතු ය.
* මේ සම්බන්ධයෙන් කිසිම ලිපි ගනුදෙනුවක් නොකෙරෙන බව විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.
* සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්ත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතු ය.
* සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

*පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ ...................................තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. සම්පූර්ණ නම :——————.
02. ලිපිනය :——————.
03. උපන් දිනය :——————.
04. 2013.02.01 දිනට වයස :——————.
05. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :——————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය)
06. විවාහක ද/අවිවාහක ද යන වග :——————.
07. දැනට තනතුරක් දරන්නේ නම් එම විස්තර :-
(i) තනතුරේ නම :——————.
(ii) එයට පත් වූ දිනය :——————.
(iii) පත්වීමේ ස්වභාවය(ස්ථිර ද/අනියම් ද/තාවකාලික ද):——————.
(iv) මැතිවරණ කොට්ඨාසය:——————.
(v) පළපුරුද්ද හා සේවා කාලය:——————.
08. අධ්‍යාපන සුදුසුකම් :——————.
(සමාර්ථ වී ඇති උපරිම ශ්‍රේණිය සඳහන් කර සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)
09. වෘත්තීය සුදුසුකම් :——————.
(තාක්ෂණික දැනුම පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)
10. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකය :——————.
(ඡායා පිටපතක් ඇමිණිය යුතු ය)

ඉහත සඳහන් අංක 01 සිට 10 දක්වා කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර, යම් විටක දී මේවා අසත්‍ය බව දැනගත් විට මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මා තේරුම් ගෙන ඇති බවට සහතික කරමි. ඉල්ලුම්පත් කැඳවීමේ දැන්වීම් පත්‍රයේ කොන්දේසිවලට යටත් වන්නෙමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

සුදුසුකම් විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල පිටපත් සමග ඉදිරිපත් කළ යුතුයි. තවද දැනටමත් මධ්‍යම රජයේ, පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් නම් අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාඝ තනතුර සඳහන් කළ යුතුයි. සියලුම අයදුම්පත් 2013.03.15 දිනට පෙර ලැබෙන සේ ලේකම්, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව, අංක 15, ගුරුදෙණිය පාර, තලාතුඔය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ නිලධාරී විසින් තීරණය කරනු ඇත. මේ තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

*අයදුම් කිරීමේ ක්‍රමය* .- අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් A4 ප්‍රමාණයේ කඩදාසියකට සකස් කළ යුතු ය.

ලේකම්,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 15 වැනි දින,
තලාතුඔය.
ගුරුදෙණිය පාර,අංක 15,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-323/1

---

## යටවත්ත ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ යටවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති යටවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | පුස්තකාල III පන්තිය | 2 | 06/2006 (iv) PL1 රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (ආරම්භක වැටුප් පියවර) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 6 කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| 02. | කාර්යාල කාර්ය සහායක III පන්තිය | 01 | පී. එල්. 1-2006A රු. 11,730-10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - 17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| 03. | විදුලි කාර්මික III පන්තිය | 01 | පී.එල්. 2-2006A රු. 12,210 - 10 x 130 - 10 x 145- 10 x 160 - 12 x 170 - 18,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br><br>*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා*<br><br>අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතා පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කරගෙන තිබිය යුතු ය.<br><br>*(අ)* වෘත්තීයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වැනි මට්ටමේ (NVQ2) හෝ 3 වැනි මට්ටමේ ( NVQ 3) සහතිකය ලබා තිබීම;<br>හෝ<br>*(ආ)* කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DYET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>*(ඇ)* ජාතික තරුණ සේවා සභාවේ (NYSE) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; |

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | හෝ<br>(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>හෝ<br>(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;<br>හෝ<br>(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව, එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>*පළපුරුද්ද :*<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම. (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 02 ක් වත් විය යුතු ය.) |
| 04. | මාර්ග කම්කරු III වැනි පන්තිය | 02 | පී. එල්. 1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 - 17,600 | දෙවරකට නොඅඩු වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සහිතව අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| 05. | සෞඛ්‍ය කම්කරු III වැනි පන්තිය | 03 | පී. එල්. 1-2006A රු. 11,730-10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - 17,600 | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණියට රු. 11,730 -10 x 120 (09 වැනි වසරට) නියමිත විෂය නිර්දේශය සම්පූර්ණ කර තිබිය යුතු ය. |
| 06. | රියැදුරු III පන්තිය | 02 | පී.එල්. 3 - 2006A රු. 12,470- 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර)<br>*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*<br>අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතාව පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කරගෙන තිබිය යුතු ය.<br>බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර නිපුණත්ව සහතිකයක් ලබා තිබිය යුතු අතර තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වෘත්තිය ප්‍රවීණතා බලපත්‍රයක් ලබා සිටිය යුතු ය. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතු ය.)<br>*පළපුරුද්ද :*<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම යටත් පිරිසෙයින් අවුරුදු 03ක වත් පළපුරුද්දක් තිබිය යුතු ය. මෙම පළපුරුද්ද ලිඛිත ලියවිලි මගින් සනාථ කළ යුතු ය. එය රජයේ හෝ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබාගත් සහතිකයක් විය යුතු ය. |

*01. රියදුරු තනතුරට අදාළ යෝග්‍යතා/සුදුසුකම් :-*

(අ) අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය;
(ආ) දිවා කාලය සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය;
(ඇ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් නොලැබූ අයෙකු විය යුතු ය;
(ඈ) රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අසාධු ලේඛනයට නම ඇතුළත් නොවූ අයෙකු විය යුතු ය;
(ඉ) රියදුරු තනතුර සඳහා බඳවා ගනු ලැබීමට දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙක්, පොලිස් රථ වාහන අංශයේ නිලධාරියකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතු ය;
(ඊ) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය;

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය;
(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 3ක කාලයක් යටවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය;
(iii) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවකයින් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත. මෙම සහනය ලැබෙන්නේ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට පමණි;
(iv) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් සිටිය යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය;
(v) රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය;
(iv) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

*03. සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය;
(ii) වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායකත්වය හිමි වේ;
(iii) පත්වීම් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ;
(iv) මෙම බඳවාගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද මධ්‍යම පළාතේ පළාත් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් (වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය).

*04. අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන :-*

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතිකය;
(iii) තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත යුතු ය.);
(v) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතිකය;
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ කරනු ලැබේ.

06. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම කරනු ලැබේ.

07. *අයදුම්කළ යුතු ආකාරය :-*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම් පස ඉහළ කෙළවරේ ලියා 2013 අප්‍රේල් මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, යටවත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය යටවත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

ඩී. එම්. ලලිතා සෝමාවතී,
ලේකම්,
යටවත්ත ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 20 වැනි දින,
යටවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

**යටවත්ත ප්‍රාදේශීය සභාවේ .............................. තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————.
02. මුලකුරු සමග නම :——————————.
03. ස්ථිර ලිපිනය :——————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
05. උපන් දිනය ඃ
වර්ෂය :—————————— මාසය :—————————— දිනය :——————————.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ
අවුරුදු :—————————— මාස :—————————— දින :——————————.
07. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
08. විවාහක/අවිවාහක බව :——————————.
09. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න).
*අ.පො.ස. (සා පෙළ) විභාගය ඃ*
සමත් වර්ෂය :——————————. විභාග අංකය :——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01.<br>02.<br>03.<br>04. | | 05.<br>06.<br>07.<br>08. | |

අ. පො. ස. (උ/පෙළ) විභාගය ඃ
සමත් වර්ෂය:——————————. විභාග අංකය:——————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 01.<br>02.<br>03.<br>04. | |

12. (i) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :——————————.
(ii) වෘත්තීය සුදුසුකම්:——————————.
(iii) සේවා පළපුරුද්ද:——————————.
1. දැනට සේවය කරන ආයතනය :——————————.
2. දැනට දරන තනතුර:——————————.
3. එම තනතුරට පත් වූ දිනය:——————————.
4. මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර:——————————.
13. ඔබ දැනටමත් මෙම සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර:——————————.
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ආදේශක යන වග:——————————.
එම තනතුරට පත් වූ දිනය :——————————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:——————————.

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

***දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය***

................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ................................ වශයෙන් සේවයෙන් නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

03-523

**කුලියාපිටිය නගර සභාව**

වයඹ පළාත් රාජ්‍ය සේවයේ කුලියාපිටිය නගර සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සේවා ගණයන්හි පුරප්පාඩු වී ඇති මෙහි පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම්ලත් අයවළුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*01. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය :*

| *තනතුරු නාමය* | *තනතුරු ගණන* | *මාසික වැටුප් පරිමාණය* |
|---|---|---|
| සෞඛ්‍ය කම්කරු | 05 | |
| සෞඛ්‍ය කම්කරු (ඝන අපද්‍රව්‍ය) කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා) | 04 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 |
| ජල කම්කරු | 01 | |
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 03 | |
| නගර ශාලා භාරකරු | 01 | |

*1.2 අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් 02ක්වත් සමත් වී තිබිය යුතු ය;

*(ආ)* සෞඛ්‍ය කම්කරුවන් බඳවා ගැනීමේ දී අවම අධ්‍යාපන සුදුසුකම වනුයේ රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (09 වසර) සමත් වී තිබීමය;

*(ඇ)* මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.

*සංලක්ෂ්‍යය :*

මෙම සේවා ගණය සඳහා බඳවා ගනු ලබන්නන් සම්බන්ධයෙන් තනතුරු නාමය සඳහන් කරනුයේ හුදෙක්ම අවසථානුකූලව කාර්යයන් පැවරීම සඳහා වන අතර පත්වීම් බලධාරියා/දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් සේවා ගණය යටතේ වූ කවර සේවකයෙකුට වුව ද තනතුරු උපලේඛනයේ සඳහන් තනතුරු නාමයන් අතුරින් ඕනෑම එකක් සහ කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් පවරනු ලැබිය හැක. තනතුරු නාමය කුමක් වුව ද ඒ සියලුම සේවකයින් එකම සේවා ගණයට අයත් සමාන තත්වයේ වූවන් ලෙස සැලකේ.

1.3 *වයස :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුයි. දැනටමත් කුලියාපිටිය නගර සභාවේ ස්ථිර තනතුරක නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ.

*02. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය :*

| 02.1 | *තනතුරු නාමය* | *තනතුරු ගණන* | *මාසික වැටුප් පරිමාණය* |
|---|---|---|---|
| | යන්ත්‍ර ක්‍රියාකරු | 02 | රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,600 |
| | ජල නළ වැද්දුම්කරු | 01 | |

02.2 *යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම්, අතිරේක සුදුසුකම් හා පළපුරුද්ද :*

*(අ) බාහිර අයදුම්කරුවන් සඳහා :*

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06 ක් වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05 ක්වත් සමත් විය යුතු ය.

*(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*

දැනට කුලියාපිටිය නගර සභාවේ ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 08 ශ්‍රේණිය (09 වසර) සමත් විය යුතු ය.

*(ඇ) ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*

තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය. (A පන්තියේ රියැදුරු බලපත්‍රයක්).

*(ඇ) පළපුරුද්ද :*

වාහන රියැදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුයි. සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුයි.

02.3 *ජලනළ වැඩ්ඩුම්කරු තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම්, අතිරේක සුදුසුකම් හා පළපුරුද්ද :*

*(අ) බාහිර අයදුම්කරුවන් සඳහා :*

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02 ක්වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර)

*(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*

කුලියාපිටිය නගර සභාවේ ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (09 වසර) සමත් විය යුතුයි.

*(ඇ) ශිල්පීය නිපුණතා :*

තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ N.V.Q. 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබිය යුතුයි.

*(ඈ) පළපුරුද්ද :*

එක් එක් වෘත්තියට අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක රාජ්‍ය සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 02කට වැඩි කාලයක් (අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර) සේවය කර තිබීම සහතිකයක් මගින් සනාථ කළ යුතුයි.

02.4 *වයස :*

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුයි. දැනටමත් කුලියාපිටිය නගර සභාවේ ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ.

03. *පොදු කොන්දේසි :*

03.1 *සියලුම තනතුරු සඳහා පොදු සුදුසුකම්*

01. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පූර්වාසන්න වසර 03ක් කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතුයි.
02. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
03. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුයි.
04. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් ඔහු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුයි.
05. දැනට කුලියාපිටිය නගර සභාවේ සේවයේ නියුතු අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.
06. මෙම තනතුරු පත් කිරීම සඳහා වන බඳවා ගැනීමේ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සුපරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සපුරා ඇත්නම් පමණි.
07. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතු ය.
08. තෝරා ගනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.
09. දැනටමත් මෙම නගර සභාවේ අදාළ තනතුරුවල තාවකාලික/අනියම්/ආදේශක පදනම මත සේවයේ නියුක්ත වූවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

04. *බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම*

01. ශිල්පීය නොවන තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අපේක්ෂකයින් බඳවා ගැනේ.

02. අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසු ඒ ඒ තනතුරට අදාළ වන පරිදි වෘත්තීය සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය ප්‍රවීනතා තහවුරු කරගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

03. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුයි :-
(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සහතික;
(ඇ) පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
(ඈ) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්;
(ඉ) වෘත්තීය/පළපුරුද්ද පිළිබඳ සහතික.

04. එක් අයදුම්කරුවෙකුට එක් තනතුරකට වඩා ඉල්ලුම් කළ හැකි අතර එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

05. අයදුම්කරුවන් මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2013.03.28 දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, කුලියාපිටිය නගර සභාව, කුලියාපිටිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

06. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතු ය.

07. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් යථා කාලයේ දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

08. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීමේ බලතල මා සතු ය.

එස්. ජේ. එස්. වනසිංහආරච්චි,
ලේකම්,
නගර සභාව - කුලියාපිටිය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කුලියාපිටිය නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත*

***කුලියාපිටිය නගර සභාවේ..........................................තනතුර සඳහා වූ අයදුම් පත්‍රය***

01. *(අ)* මුලකුරු සමග නම :————————.
*(ආ)* සම්පූර්ණ නම :————————.
02. ලිපිනය:————————.
03. *(අ)* උපන් දිනය : අවුරුද්ද:————————. මාසය:————————. දිනය:————————.
*(ආ)* 2013.03.28........................................ දිනට වයස - අවුරුදු :————————.මාස:————————. දින:————————.
04. උපන් ස්ථානය:————————.
05. දැනට පදිංචි ස්ථානය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:————————.
06. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද?:————————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය:————————.
08. විවාහක/අවිවාහක බව:————————.
09. සමත් වී ඇති ඉහළම විභාගය:————————.
10. වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්:————————.
11. මීට පෙර රජය යටතේ හෝ සංස්ථාවක සේවයේ යෙදී සිටියේ නම් ඉන් අස්වීමට හේතු:————————.
12. *(අ)* උසාවියක් මගින් ඔබට දඬුවම් දී තිබේ ද?:————————.
*(ආ)* එසේනම් දඬුවමේ ස්වභාවය:————————.
13. චරිත සහතික ලබාගත් තැනැත්තන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ස්ථිර පදිංචිය සඳහන් කරන්න.
01 ................................................................ 02 ......................................................................
................................................................ ......................................................................
14. දැනට කුලියාපිටිය නගර සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර:————————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා මෙම තනතුරට තෝරාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————.

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (දැනට සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි.) :*

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවත් දැනට.................................... වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය:————————.

03-465

## කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන/ප්‍රාථමික ශිල්පීය යන පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය මාසික (රා.ප.ච./06/2006 iv අනුව)* | *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1 | සෞඛ්‍ය කම්කරු | 04 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 115 - 12 x 160 - රු.17,600 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් 08 ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය. (09 වසර) |
| 2 | මාර්ග කම්කරු | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 115 - 12 x 160 - රු.17,600 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර සා/ පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් 02 ක් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |
| 3 | විදුලි කාර්මික | 01 | රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 12 x 170 - රු.18,860 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින්/ අධ්‍යයන පොදු සහතිකපත්‍ර සා/ පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගනණකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06 ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05 ක් සමත් වී තිබිය යුතු ය. තනතුරේ කාර්ය භාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන NVQ4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්දක් තිබීම (සේවා සහතිකය මගින් සනාථ කළ යුතුය.) |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (ඡන්දහිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන සහතිකයකින් සනාථ විය යුතු ය. ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු සේවකයින්ට පමණක් මෙය අදාළ නොවේ.)
(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් ස්ථිර සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.).
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
(v) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වන අතර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් බඳවා ගනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු දායක මුදල් ගෙවිය යුතු ය.
(ii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥා පනත්/පනත්වල විධිවිධානවලට ද, කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත 2013.04.08 දිනට පෙර, "ලේකම්, කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව, කොබෙයිගනේ "යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ, '............................ තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත,' යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය :-

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතිකය
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය
4. මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය
5. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්
6. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික
7. සේවයේ පළපුරුද්ද පිළිබඳ සහතිකය

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. එම්. නිමල් ජයසිංහ,
ලේකම්,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 05 වැනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කොබෙයිගනේ.

**ආදර්ශ අයදුම් පත්‍රය**

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය/ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම 2013.................................. තනතුර සඳහා අයදුම්පත්‍රය

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————————.
   මුලකුරු වලින් හැඳින්වෙන නම් :-
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————————.
3. ස්ථිර ලිපිනය:————————.
4. ස්ත්‍රී පුරුෂ භාවය:————————.
5. උපන් දිනය:————————.
   අවුරුද්ද :————————,මාසය:————————, දිනය:————————.
6. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
   අවුරුදු:————————,මාස:————————, දින:————————.
7. ජාතික හැඳුනුම්පත් අංකය:————————.
8. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින්ද?:————————.
   ලියාපදිංචි වීමෙන් ද?
9. අධ්‍යාපන සුදුසුකම්:————————.
   i. අ.පො.ස. (සා./පෙළ) විභාගය
      සමත් වර්ෂය හා විභාග අංකය:————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |
| 05. | |
| 06. | |
| 07. | |
| 08. | |

අ.පො. ස(උ/පෙළ) විභාගය
සමත් වර්ෂය හා විභාග අංකය:————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 01.<br>02.<br>03.<br>04. | |

ii. වෙනත් සුදුසුකම් :————————.

10. වෘත්තීය සුදුසුකම්:————————.
11. සේවා පළපුරුද්ද:————————.
 11.1 දැනට සේවය කරන ආයතනය:————————.
 11.2 දැනට දරන තනතුර:————————.
 11.3 එම තනතුරට පත් වූ දිනය:————————.
 11.4 මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන...................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.............................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

අත්සන:————————.
නම:————————.
පදවි නාමය:————————.
දෙපාර්තමේන්තුව/ආයතනය:————————.
දිනය:————————.

03-320

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### ශිල්පීය, අර්ධ ශිල්පීය, ශිල්පීය නොවන III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව සඳහා පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**උපලේඛනය**

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* | *පළපුරුද්ද* |
|---|---|---|---|---|---|---|
| 01 | රියදුරු | 02 | රා.ප.ච. 6/2006 (iv) - PL3 2006A- රු. 12,470- 10 x 130 - 10 x 145 10 x 160 - 12 x 170 රු. 18,860 | බාහිර අයදුම්කරුවන් සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව සමත්ව තිබිය යුතුය. | තාර බර, හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ ට්‍රේලර් මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතා | වාහන රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|---|---|---|---|
| | | | | (වෛකල්පිත විෂයන් හැර අවම වශයෙන් එක් වරකදී විෂයන් 05 ක් සමත් විය යුතුය.)<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*<br><br>දැනට ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජයේ අනුමත පාසැලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.) | සහතිකයක් ලබා තිබිය යුතුය. | |
| 02. | විදුලි කාර්මික | 01 | රා.ප.ච. 6/2006 (iv) -PL2 2006A රු.12,210 - 10 x 130-10 x 145- 10 x 160 - 12 x 170 -18,600 | එම | තනතුරේ කාර්යභාරයට අදාලව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන (NVQ) 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම. | පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්දක් තිබීම (සේවා සහතික මගින් සනාථ කළ යුතුවේ.) |
| 03. | යන්ත්‍ර ක්‍රියාකරු | 01 | එම | *බාහිර අයදුම්කරුවන් සඳහා* අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙන් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර)<br>*අභ්‍යයන්තර අයදුම්කරුවන් සඳහා*<br>දැනට ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර)සමත් විය යුතුය. (අභ්‍යයන්තර අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.) | (අ) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයකින් හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතන විසින් පිළිගත් ආයතනයක යන්ත්‍ර ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය තිබිය යුතුයි.<br>(ආ) දෙපාර්තමේන්තු සේවකයින් සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අවසාන සහිතක පත්‍ර විභාගය හෝ කාර්මික විද්‍යාලයක යන්ත්‍ර ශිල්පය පිළිබඳ ව අධ්‍යාපන පුහුණු සහතිකය ලබා තිබීම. | පිළිගත් ආයතනයක වසර දෙකක පළපුරුද්දක් තිබීම (සේවා සහතික මගින් සනාථ කළ යුතුවේ.) |
| 04. | නළ ළිං පොම්ප කාර්මික | 01 | රා.ප.ච. 6/2006 (iv)PL - 1-2006A - රු. 11,730-10 x 120 - 10 x 130-10 x 145 - 12 x 160-රු. 17,600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙන් විෂයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර) | තනතුරට අදාල වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳව N.V.Q. 2 හෝ 3 මට්ටමේ ප්‍රවීනතා සහතිකය ලබා තිබීම. | අදාල ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වසර 2 ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහිතක මගින් සනාථ කළ යුතු ය.) |
| 05. | මුරකරු | 02 | එම | එම | - | - |
| 06. | පුස්තකාල සහායක | 02 | එම | එම | - | - |
| 07. | වෙළඳසැල් පරිපාලක (භාරකරු) | 01 | එම | එම | - | - |
| 08. | මාර්ග කම්කරු (ක්ෂේත්‍ර කම්කරු) | 10 | එම | එම | - | - |
| 09. | කාර්යාල කාර්ය සහායක | 01 | එම | එම | - | - |
| 10. | සෞඛ්‍ය කම්කරු | 04 | එම | රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය සමත් වී තිබීම (9 වසර) | - | - |

*වෙනත් සුදුසුකම් :-*

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනකට නොඅඩු කාලයක් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම්ගේ අත්සනින් යුතු ග්‍රාම නිලධාරි සහතිකයකින් සනාථ විය යුතුය.)
iii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 කට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපැවැත්වේ.)
iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
v. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

*12. බඳවා ගැනීමේ ක්‍රමය :-*

i. ඉහත තනතුරු සඳහා අයදුම් කර ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පෙනී සිටිය යුතු අතර එහිදී අධ්‍යාපන හා අතිකුත් සුදුසුකම් පරීක්ෂා කිරීම ද වාචික පරීක්ෂණයක ද ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.
ii. ශිල්පීය නිපුණතාවය අවශ්‍ය වන තනතුරු සඳහා ප්‍රායෝගික පරීක්ෂණයකට ද පෙනී සිටිය යුතු ය.

*13. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

i. මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. (වසර තුනක පරිවාස කාලයකට යටත් වේ.)
ii. ඉහත බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව 2008.11.19 වන දින ගරු වයඹ ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසි වලට ද, මුදල් රෙගුලාසි වලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතුය.

14. *අයදුම්පත ඉදිරිපත් කිරීම :-*

i. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා අයදුම්පත් 2013 මාර්තු 30 දින හෝ එදිනට පෙර ලේකම්, කුලියාපිටිය ප්‍රාදේශීය සභාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
ii. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර."....................................." තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතු ය.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සහතික;
(ඇ) පාසැල් හැර යාමේ සහතිකය;
(ඈ) පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.);
(ඉ) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්;
(ඊ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික;
(උ) ප්‍රවීනතා සහතික.

මෙම අයදුම්පත් කැඳවීමකින් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

ජේ. ඒ. සෝමසිරි ජයසිංහ,
ලේකම්,
කුලියපිටිය ප්‍රාදේශීය සභාව.

කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

*කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන/අර්ධ ශිල්පීය/ශිල්පීය III ශ්‍රේණියේ ...................................... තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය*
*(අදාළ තනතුර සඳහන් කරන්න.)*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————.

03. ස්ථිර ලිපිනය :————————.
04. ග්‍රාම නිලධාරි කොට්ඨාසය:————————.
05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:————————.
06. දිස්ත්‍රික්කය:————————.
07. උපන් දිනය : වර්ෂය:————————, මාසය:————————, දිනය:————————.
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————————, මාස:————————, දින:————————.
09. ස්ත්‍රී/පුරුෂභාවය:————————.
10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග:————————.
11. විවාහක/අවිවාහක බව:————————.
12. ජාතික හැඳුනුම්පත් අංකය:————————.
13. අධ්‍යාපන සුදුසුකම් :
අ.පො.ස. (සා.පෙළ) විභාගය :
සමත් වර්ෂය හා විභාග අංකය :————————.

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |

14. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :————————.
15. සේවා පළපුරුද්ද :————————.

(අ) දැනට සේවය කරන ආයතනය
(ආ) දැනට දරන තනතුර
(ඇ) එම තනතුරට පත් වූ දිනය
(ඈ) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන,

දිනය :————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන.................................. මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම ආයතනයේ....................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

————————.
ආයතන ප්‍රධානියාගේ හෝ බලය
පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම:————————.
පදවි නාමය :————————.
ආයතනය:————————.
දිනය :————————.

03-451

## දොම්පෙ ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

දොම්පෙ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු තනතුරු වර්ගය සහ ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ. :

| අනු අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය හා වැටුප් කේත අංකය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 1. | සෞඛ්‍ය පරිපාලක II ශ්‍රේණිය | 01 | රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 10 x 320 - 22,040 (MN1-2006A) 4 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (අ) සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව හා ශාරීරික විද්‍යාව/සෞඛ්‍ය විද්‍යාව විද්‍යාව ඇතුළුව යටත් පිරිසයින් විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වී තිබීම; හෝ<br>(ආ) සිංහල/දෙමළ, ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව හා ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සාමාර්ථය ලබා සිටින පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නකු වීම හෝ<br>(ඇ) පළාත් පාලන ආයතනයක අවුරුදු 10 ට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි පංතිය සාමාර්ථය ලබා තිබීම. |
| 2. | ජලපොම්ප ක්‍රියාකරු III ශ්‍රේණිය | 01 | 12,210 - 10 x 130 - 10 x 145 -10 x 160- 12 x 170 - 18,600 (PL2-2006A) 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02 ක් සමත් වී තිබීම සහ<br>(ආ) තනතුරට අදාලව අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.) |
| 3. | ආදාහනාගාර ක්‍රියාකරු සහායක III ශ්‍රේණිය | 02 | රු. 11,730 - 10 x 120- 10 x 130 - 10 x 145 12 x 160 - 17,600 (PL1 .2006A) 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9වසර සමත් වී තිබිය යුතුය. |
| 4. | ක්ෂේත්‍ර කම්කරු (කාර්යාල සේවක සේවය) (III ශ්‍රේණිය) | 17 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - 17,600 (PL1-2006A) 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | අවම වශයෙන් 5 වන ශ්‍රේණිය/6 වසර සමත් වී තිබිය යුතුය. |
| 5. | සෞඛ්‍ය කම්කරු (කාර්යාල සේවක සේවය) III ශ්‍රේණිය) | 09 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - 17,600 (PL1-2006A) 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

*02. බඳවා ගැනීමේ කොන්දේසි -*

1. ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
2. යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නව වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතුය.

4. ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට අවු 18 ත් 45 ත් අතර විය යුතුය. දැනටමත් සේවයේ යෙදී සිටින සේවක අයට මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
5. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාලව ඒ ඉදිරියේ ඉල්ලා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
6. බඳවා ගැනීමේ පටිපාටියට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයට සහ ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.
7. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතුරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*03. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. සියළුම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාල පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත් විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කරනු සඳහාත් දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධි විධානයන්ට එකඟව ක්‍රියා කළ යුතු ය.

මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ විධි විධාන වලට ද බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට ද දෙපාර්තමේන්තු නියෝග වලට ද බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට ද දෙපාර්තමේන්තු නියෝග වලට ද බස්නාහිර පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ දොම්පෙ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

04. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය.

මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක (අංක 01 සිට 10 දක්වා එක පැත්තක ද අංක 11 සිට ඉදිරියට අනෙක් පැත්ත ද) වනසේ කඩදාසි යේ දෙපැත්තේ අයදුම්පත් පිලියෙල කර ඉදිරිපත් කල යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කොට 2013.03.22 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, දොම්පෙ ප්‍රාදේශීය සභාව, කිරිදිවැල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික පිටපත් එවිය යුතුය :

(i) උප්පැන්න සහතිකය;
(ii) ජාතික හැඳුනුම්පත;
(iii) අධ්‍යාපන සහතික හෝ ඉහලම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික;
(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කල තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය;
(v) සේවා සුදුසුකම් දැක්වෙන සහතිකය;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහිතය.

එම්. යූ. ආර්. මද්දුමගේ,
ලේකම්,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 28 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

***ආදර්ශ අයදුම් පත්‍රය***

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දොම්පෙ ප්‍රාදේශීය සභාවේ... .....................................තනතුර සඳහා ආදර්ශ අයදුම් පත්‍රය**

1. (i) මුලකුරු සමග නම :——————————.
   (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
   ග්‍රාම නිලධාරි කොට්ඨාසය:——————————.
3. ස්ථිර ලිපිනය:——————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
5. උපන් දිනය: අවුරුද්ද:——————————, මාසය:——————————, දිනය:——————————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.

7. විවාහක/අවිවාහක භාවය :—————————.
8. ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයසඃ අවුරුදු :—————————.මාසඃ—————————. දිනඃ—————————.
9. බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කාලයඃ—————————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ලියාපදිංචියෙන් ද යන වගඃ—————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාගය පිළිබඳ විස්තර)ඃ—————————.
(අ) සමත් වූ වසර :—————————.ශ්‍රේණියඃ—————————.
(ආ) විභාග අංකයඃ—————————. වර්ෂයඃ—————————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ඇ) අ.පො. (උ. පෙ.) විභාගය :—————————.
විභාග අංකයඃ—————————. වර්ෂයඃ—————————.

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |

12. වෘත්තීය සුදුසුකම් :—————————.
13. සේවා පළපුරුද්දඃ—————————.
14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ දඃ—————————.

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

—————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————————.

03-324

---

**පුත්තලම නගර සභාව**

පුත්තලම නගර සභාවේ පුරප්පාඩු වී ඇති වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ III ශ්‍රේණියට අදාල පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | වෙළඳපොල පරිපාලක | 01 | PL1 2006A | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x145 - 10 x160 - රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 02. | සෞඛ්‍ය පරිපාලක | 01 | PL1 2006A | රු. 11, 730 - 10 x 120- 10 x 130 - 10 x 145 - 10 x 160 - රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 03. | කාර්යාල කාර්ය සහායක | 03 | PL1 2006A | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 10 x 160- රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 04. | මුරකරු | 01 | PL1 2006A | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 10 x 160- රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 05. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 13 | PL1 2006A | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 10 x 160 - රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 06. | සෞඛ්‍ය කම්කරු | 16 | PL1 2006A | රු. 11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 10 x 160- රු. 17,600 | රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 වන ශ්‍රේණිය සමත් විය යුතුය. |
| 07. | පුස්තකාල කම්කරු | 04 | PL1 2006A | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 10 x 160- රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 08. | නගරශාලා භාරකරු | 01 | PL1 2006A | රු. 11,730 - 10 x 120 - 10 x 130- 10 x 145 - 10 x 160- රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 09. | සුසාන භූමි භාරකරු | 01 | PL1 2006A | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 10 x 160 - රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 10. | යන්ත්‍ර ක්‍රියකාරු | 01 | PL2 2006A | රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170- රු. 18,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)<br><br>රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක යන්ත්‍ර ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය<br><br>දෙපාර්තමේන්තු සේවකයින් සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අවසාන සහතික පත්‍ර විභාගය හෝ කාර්මික විද්‍යාලයක යන්ත්‍ර ශිල්පය පිළිබඳ අවසාන පුහුණු සහතිකය<br><br>පිළිගත් ආයතනයක වසර 02 ක පළපුරුද්ද (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 11. | වැඩ පරිපාලක | 01 | PL2 2006A | රු. 12,210 - 10 x 130 - 10 x 145- 10 x 160 - 12 x 170 රු. 18,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය.<br><br>තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ N.V.Q.2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වසර 02 ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 12. | ගිණිබට | 06 | PL2 2006A | රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170- රු. 18,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් 02 ක් සමත් විය යුතුය.<br><br>තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ N.V.Q. 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වසර 02 ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 13. | රියදුරු | 01 | PL3 2006A | රු. 12,470 -10 x 130- 10 x 145 - 10 x 160 - 12 x 170- රු. 18,860 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06 ක් වත් සමත් වී තිබීම. අවම වශයෙන් එක් වතාවක දී විෂයන් 05 ක් සමත් විය යුතුය.<br><br>තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස්රථ පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස් විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා තිබීම.<br><br>වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |

*පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.

(ii) අයදුම්කරු පුත්තලම නගර සභා බල ප්‍රදේශය තුළ අනුගාමී වසර 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

(iii) පුත්තලම නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

(iv) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(v) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ. එහෙත් එම තනතුරට බඳවා ගන්නා දිනට උපරිම වයස ඉක්මවා නොතිබිය යුතුයි.)

(vi) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුය.

(vii) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලබයි.

(viii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පුත්තලම නගර සභාවේ ලේකම් සතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.

(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයන්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව ක්‍රියාකිරීමට සියළුම සේවයකින් බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම් කළයුතු ආකාරය :-*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2013.03.22 වන දින හෝ ඊට පෙර ලැබෙනසේ "ලේකම්, නගර සභාව, පුත්තලම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරනු ලබන තනතුර "........................................" යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පුත්තලම නගර සභාවේ ලේකම් සතුය.

තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතිකය
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.)
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක්
(v) පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික
(vi) පුත්තලම නගර සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

ඩබ්. ජී. නිශාන්ත කුමාර,
ලේකම්,
පුත්තලම නගර සභාව.

2013 පෙබරවාරි මස 20 වැනි දින,
පුත්තලම නගර සභාව,
පුත්තලම.

*ආදර්ශ අයදුම්පත*

*පුත්තලම නගර සභාවේ ................................................................... ..තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————.

03. තැපැල් ලිපිනය :——————.

04. දුරකථන අංකය:——————.

05. උපන් දිනය ඃ වර්ෂය:———————. මාසය:———————. දිනය:———————.

06. ජාතික හැඳුනුම්පත් අංකය:———————.

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු :———————.මාස:———————. දින:———————.

08. ස්ත්‍රී/පුරුෂ භාවය:———————.

09. විවාහක/අවිවාහක බව:———————.

10. ජාතිය :———————.

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද ? ලියාපදිංචි වීමෙන් ද? යන වග :———————.

12. අධ්‍යාපන සුදුසුකම්:———————.

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :———————.

14. ඔබ දැනටමත් පුත්තලම නගර සභාවේ සේවය කරන්නේ නම් :———————.

(i) දැනට දරන තනතුර :———————.
(ii) එම තනතුරට පත් වූ දිනය:———————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මතද):———————.

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර :———————
.

මෙම අයදුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදි වූ ත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝර ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි. එම සියළුම කොන්දේසිවලට මා යටත් වන බව ද මෙයින් දන්වා සිටිමි.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:———————.

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන ........................................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ...................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

———————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:———————.
තනතුර :———————.
නිල මුද්‍රාව :———————.

03-472

## පුත්තලම ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

පුත්තලම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අයදුම් කළ යුතු ආකාරය :*

මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 2013.03.22 දින හෝ ඊට පෙර "ලේකම්, පුත්තලම ප්‍රාදේශීය සභාව, මදුරන්කුලිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙලවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍රය තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. (අයදුම්පත ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතුය.) අසම්පූර්ණ හා පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණය (සෞඛ්‍ය කම්කරු) | 09 | PL - 1 - 2006 - A<br>රු. 11,730-10x120- 10 x 130- 10 x 145- 12 x 160-රු. 17,600 | 8 ශ්‍රේණිය සමත්/9 වසර |
| 02 | ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණය (පුස්තකාල සහායක) | 01 | PL - 1 - 2006 - A<br>රු. 11,730-10x120- 10 x 130- 10 x 145- 12 x 160-රු. 17,600 | අ.පො.ස.(සා/පෙ.) විභාගයේ දී විෂයයන් 02ක් එකවර සමත් වීම |
| 03 | ප්‍රාථමික ශිල්පීය සේවක ගණය (රියදුරු III පන්තිය) | 01 | PL - 3 - 2006 - A<br>රු. 12,470-10x130-10 x 145- 10 x 160-12 x 170-රු. 18,860 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා ගැනීම.<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍රය C, C1, D, D1 කාණ්ඩ සඳහා ලබා තිබිය යුතුය.<br><br>දිවා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් යෝග්‍ය තත්ත්වයෙන් සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br><br>අවම උස අඩි 5 ක් විය යුතුය.<br><br>මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය. |
| 04 | ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණය (කාර්යාල කාර්යය සහායක IIIපන්තිය) | 01 | PL - 1 - 2006 - A<br>රු. 11,730-10x120- 10 x 130- 10 x 145- 12 x 160-රු. 17,600 | අ.පො.ස (සා/පෙ) විභාගයේ දී විෂයයන් 02ක් එකවර සමත් වීම |
| 05 | ප්‍රාථමික ශිල්පීය සේවක ගණය (යන්ත්‍ර ක්‍රියාකරු III ශ්‍රේණිය) | 01 | PL - 3 - 2006 - A<br>රු. 12,470-10x130-10 x 145- 10 x 160-12 x 170-රු. 18,860 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා/පෙ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම.<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍රය C, C1, D, D1 කාණ්ඩ සඳහා ලබා තිබිය යුතුය. |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | ICTAD සහතිකය ලබා තිබිය යුතුය.<br><br>දිවා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් යෝග්‍ය තත්ත්වයෙන් සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br><br>අවම උස අඩි 5 ක් විය යුතුය.<br><br>මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.<br><br>රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක යන්ත්‍ර ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය; හෝ<br><br>දෙපාර්තමේන්තු සේවකයින් සඳහා කාර්මික විද්‍යාලයක යන්ත්‍ර ශිල්පය පිළිබඳ අවසාන පුහුණු සහතිකය,<br><br>පිළිගත් ආයතනයක වසර 02ක පළපුරුද්ද (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 06 | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණය (විදුලි කාර්මික III ශ්‍රේණිය) | 01 | PL - 2 - 2006 - A<br>රු. 12,210-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා/පෙ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම.<br><br>තනතුරේ කාර්යභාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන N. V. Q. 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br><br>පිළිගත් ආයතනයක වසර 02ක පළපුරුද්ද (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |

02. *බඳවා ගැනීමේ ක්‍රමය* .- අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි* .- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ/වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

04. *වෙනත් පොදු කොන්දේසි* :

(i) තෝරාගනු ලබන්නේ අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ව ය. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

(iii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.

(iv) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර,එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලබයි.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(vi) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචි ඇති අයෙකු විය යුතුය. (ඡන්ද නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

(vii) පුත්තලම ප්‍රාදේශීය සභාවේ දැනටමත් ස්ථිර, අනියම්, ආදේශක, දීමනා හෝ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ. (සතුටුදායක සේවා කාලයක් තිබූ බවට සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

(viii) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුල වරදකට (අවවාද කිරීම් හැර) දඬුවමක් ලබා නැත්තා වූද, මෙම කාලය තුළ යෙදුන වැටුප් වර්ධක නියමිත දිනට ලබා ගත්තා වූද, සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. තෝරා ගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතුය.

(ix) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසි හා රජයේ දෙපාර්තමේන්තු නියෝග වලට ද, වයඹ පළාත් සභාව හා පුත්තලම ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

05. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :-

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතිකය
(iii) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය
(iv) සේවා සහතිකය (දැනට රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි)
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරීන්ගෙන් විය යුතුය.)

06. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල පුත්තලම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය. දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටලුවක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

ජේ. එම්. ඩී, ඒ. වීරසිංහ,
ලේකම්,
පුත්තලම ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 13 වැනි දින,
පුත්තලම ප්‍රාදේශීය සභාවේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*වයඹ පළාත් රාජ්‍ය සේවයේ, පුත්තලම ප්‍රාදේශීය සභාවේ, සෞඛ්‍ය කම්කරු/පුස්තකාල සහායක/රියදුරු/කාර්යාල කාර්යය සහායක/යන්ත්‍ර ක්‍රියාකරු සහ විදුලි කාර්මික තනතුරු සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය*

01. (අ) මුලකුරු සමග නම :——————————.
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.

02. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
(ආ) ස්ථිර පදිංචි ලිපිනය:——————————.

03. ස්ත්‍රී/පුරුෂභාවය :——————————.

04. (අ) උපන් දිනය:——————————.
වර්ෂය:————. මාසය:——————.දිනය:——————.
(ආ) 2013.03.08 දිනට වයස :
අවුරුදු:—————. මාස :—————. දින :——————.

05. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
06. විවාහක/අවිවාහක බව:——————————.
07. ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද ? එසේ නම් උපතින්ද? ලියාපදිංචිවීමෙන්ද යන බව:——————————.
08. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද? එසේ නම් විස්තර:——————————.
09. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) විභාගයේ නම :——————————.
(ආ) විභාග අංකය :——————————.
(ඇ) විභාග වර්ෂය :——————————.
(ඈ) සමත් විෂයයන් :——————————.

10. වෙනත් සුදුසුකම් :——————————.

11. ඔබ දැනටමත් මෙහි සේවය කරන්නේනම් සේවා කාලය, විස්තර හා එම පත්වීමේ ස්වභාවය (ස්ථිර, අනියම්,තාවකාලික, දීමනා, ආදේශක යන වග):—

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තෙරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

*දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා අයාතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ..................................................මයා./මිය./මෙනවිය, දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොන ආකාරයෙන් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

————————,
දෙපාර්මේන්තු/ආයතන ප්‍රධානියාගේ
හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය :——————
පදවි නාමය හා ආයතනය :——————

03-397

---

## කටාන ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

කටාන ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර අධ්‍යාපන සහතික වල පිටපත් සමග “ලේකම්, කටාන ප්‍රාදේශීය සභාව, දෙමංහන්දිය” යන ලිපිනයට 2013.03.31 වෙනි දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල සේවක සේවයේ III මාර්ග කම්කරු (වැඩ ක්ෂේත්‍ර කම්කරු) | 10 | රු. 11,730-10x120-10 x 130-10 x 145-15 x 160-රු. 17,600 (PL 1 - 2006 A) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 5 වැනි ශ්‍රේණිය/6 වසර සමත්වී තිබීම |
| 02 | කාර්යාල සේවක සේවයේ III පුස්තකාල කම්කරු (වැඩ/ක්ෂේත්‍ර කම්කරු) | 02 | රු. 11,730-10x120-10 x 130-10 x 145-15 x 160-රු. 17,600 (PL 1 - 2006 A) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය සමත් වී තිබීම. |
| 03 | කාර්යාල සේවක සේවයේ III (සෞඛ්‍ය කම්කරු) | 20 | රු. 11,730-10x120-10 x 130-10 x 145-15 x 160-රු. 17,600 (PL 1 - 2006 A) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 04 | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | රු. 12,210-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,600 (PL 2 - 2006 A) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | උපලේඛන අංක 01 හි සඳහන් පරිදි |
| 05 | රියදුරු | 01 | රු. 12,470-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,860 (PL 2 - 2006 A) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | උපලේඛන අංක 02 හි සඳහන් පරිදි |

*උපලේඛන අංක 01*

*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-*

අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම, සහ අදාහනාගාර ක්‍රියාකරු තනතුරේ අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයන් ඉදිරිපත් කළ යුතුය.)

*බාහිර අයදුම්කරුවන් සඳහා :-*

ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී හෝ අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම;

සහ

අදාහනාගාර ක්‍රියාකරු තනතුරට අදාළව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

අදාහනාගාරයේ ක්‍රියාකාරිත්වය පරීක්ෂාව,විදුලිය ක්‍රියාකාරිත්වය, ගෑස් ක්‍රියාකාරිත්වය, යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය, ගැන අවධානයෙන් සිටීම, මෘත ශරීර නියමිත වේලාවන් අනුව ආදාහනය කිරීම හා ආදාහනාගාරයේ සියලුම නඩත්තු කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම.

*උපලේඛන අංක 02*

අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 08 ශ්‍රේණිය/ 09 වසර සමත් වී තිබීම;

සහ

පෞද්ගලික කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

විශේෂයෙන් ටේලර් සහිත ට්‍රැක්ටර් පැදවීමට හැකියාව තිබිය යුතුය.
වාහන රියැදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.
අවම උස අඩි 5ක් විය යුතුය.
දිවා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදවීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

පවත්වනු ලබන ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

*01. සේවා කොන්දේසි හා නියමයන් :*

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ආ) වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(ඇ) තෝරාගනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුලදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01 ක වැඩ පරීක්ෂණ කාලයකට යටත් කර බඳවා ගනු ලැබේ.

*02. වෙනත් පොදු කොන්දේසි :*

(අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18කට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.
(දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
(ආ) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික විය යුතුයි.
(ඇ) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුයි. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
(ඈ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.
(ඉ) අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතුය.
(ඊ) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය* ඃ

කාර්යාල සේවක සේවයේ වැඩ/ක්ෂේත්‍ර(මාර්ග/පුස්තකාල) කම්කරු, සෞඛ්‍ය කම්කරු, ආදාහනාගාර ක්‍රියාකරු, රියදුරු සහ පුස්තකාල සහායක තනතුරු සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/95ට අනුකූලව සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමෙන් තෝරා ගනු ලැබේ.

ඊ. ඩී. නන්දාවතී,
ලේකම්,
කටාන ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 22 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභා කාර්යාලය,
දෙමංහන්දිය.

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ...............................................තනතුර සඳහා අයදුම්පත්‍රය***

*කටාන ප්‍රාදේශීය සභාව*

01. මුලකුරු සමග නම :——————————
මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————
02. ස්ථිර ලිපිනය :——————————
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————
04. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
05. උපන් දිනයඃ අවුරුද්ද .:———— මාසය:———— දිනය :—————
06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු.:———— මාස:———— දින :—————
07. ස්ත්‍රී/පුරුෂ භාවය:—————————— විවාහක/අවිවාහක බව:——————————
08. ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ උත්පත්තියෙන්ද/ලියාපදිංචිවීමෙන්ද යන වග :——————————
09. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
අ.පො.ස. (සා/පෙළ) විභාගය ඃ
සමත් වර්ෂය හා විභාග අංකය :——————————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

10. 1. වෙනත් සුදුසුකම් :——————————
2. වෘත්තීය සුදුසුකම් :——————————
3. සේවා පළපුරුද්ද :——————————
11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්, එම සේවා කාලය හා විස්තර, එම පත්වීමේ ස්වභාවය ස්ථිර/අනියම්/තාවකාලික:—
12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:——————————

මෙහි සඳහන් මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව, මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

***ආයතන ප්‍රධානියාගේ සහතිකය***

මෙම ඉල්ලුම්කරුවන..........................මයා./මිය./මෙනවිය මෙම ආයතනයේ .................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————
ආයතන ප්‍රධානියා.

අත්සන :——————————
නම :——————————
පදවිය :——————————
දිනය :——————————

03-525

**ගම්පහ ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගම්පහ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක - කාර්යාල සේවක සේවය II ශ්‍රේණිය | 01 | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (රා.ප.ච. 6/2006 iv) PL - 1 - 2006 - A අනුව වැටුප් පරිමාණයේ 12 පියවර ආරම්භක වැටුප් පියවර වේ.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත්විය යුතුවේ. |
| 02 | පුස්තකාල සහායක - කාර්යාල සේවක සේවය II ශ්‍රේණිය | 02 | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (රා.ප.ච. 6/2006 iv) PL - 1 - 2006 - A අනුව වැටුප් පරිමාණයේ 12 පියවර ආරම්භක වැටුප් පියවර වේ.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත්විය යුතු වේ. |
| 03 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු - කාර්යාල සේවක සේවය III ශ්‍රේණිය | 15 | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (රා.ප.ච. 6/2006 iv) PL - 1 - 2006 - A අනුව වැටුප් පරිමාණයේ 01 පියවර ආරම්භක වැටුප් පියවර වේ.) | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය/09 වසර සමත් වී තිබිය යුතු ය. |
| 04 | සෞඛ්‍ය කම්කරු - කාර්යාල සේවක සේවය III ශ්‍රේණිය | 10 | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (රා.ප.ච. 6/2006 iv) PL - 1 - 2006 - A අනුව වැටුප් පරිමාණයේ 01 පියවර ආරම්භක වැටුප් පියවර වේ.) | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 05 | රියදුරු රියදුරු සේවය II ආ | 04 | රු. 12,470-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,860 (රා.ප.ච. 6/2006 iv) PL - 3 - 2006 - A අනුව වැටුප් පරිමාණයේ 01 පියවර ආරම්භක වැටුප් පියවර වේ.) | (i) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් විය යුතු ය.<br>(ii) තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව හෝ ඊට වැඩි බර පන්තියක මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය.<br>(iii) වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය.<br>(iv) අවම වශයෙන් උස අඩි 05ක් විය යුතු ය.<br>(v) දිවා සහ රාත්‍රී කාලවල සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>(vi) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනීමක් තිබිය යුතු ය. |

*(02) බඳවා ගැනීමේ කොන්දේසි*

1. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
2. යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
3. බස්නාහිරි පළාත තුළ අවම වශයෙන් වසර 03 ක ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.

4. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාලව ඒ ඉදිරියේ ඉල්ලා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.
5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
6. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබුවෙකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබුවකු නොවිය යුතු ය.
7. බඳවා ගැනීමේ පරිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කර නියමිත අධ්‍යාපන සුදුසුකම් සහ ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කර ලබා ගන්නා ඉහල ලකුණු මත සුදුස්සන් තෝරාගනු ලැබේ.

*(03) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(2) බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර, ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

(3) බඳවාගනු ලබන තනතුරෙහි අදාළ රාජකාරී වලට අනුකූලව ක්‍රියා කිරීමට ඔබ බැඳී සිටිය යුතු ය.

(4) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත් දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකගව ක්‍රියා කළ යුතුය.

(5) ඉහත දැක්වෙන බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව, ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද දෙපාර්තමේන්තු නියෝග වලටද , බස්නාහිර පළාත් සභාවේ හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ වරින්වර නිකුත් කරන රෙගුලාසි වලට හෝ නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතු ය.

*(04) අයදුම්පත් ඉදිරිපත් කිරීම*

(1) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාරව (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කර අයදුම්පත පැහැදිලිව සකස් කර, 2012.03.20 වැනි දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ගම්පහ ප්‍රාදේශීය සභාව, මිරිස්වත්ත, මුදුන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(2) අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ "ඉල්ලුම්කරන තනතුර" සඳහන් කල යුතු ය.

(3) මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනිව සහ අසම්පූර්ණ අයදුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කෙරේ. තැපෑලේදී නැතිවුණ අයදුම්පත්‍ර සම්බන්ධවද වග කීමට නොබැඳේ.

(4) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. (මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයෙ'දී ඉදිරිපත් කළ යුතුය)

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතිකය
(iii) පදිංචිය තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනුඅත්සන සහිත ග්‍රාමනිලධාරී විසින් නිකුත් කළ සහතිකය
(iv) සේවා සුදුසුකම් /සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 2ක්

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල ගම්පහ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

පී. ප්‍රේමා සෙනෙවිරත්න,
ලේකම්,
ගම්පහ ප්‍රාදේශීය සභාව.

2013 ක් වූ පෙබරවාරි මස 21 වැනි දින,
හෙනරත්ගොඩ, මුදුන්ගොඩ,
ගම්පහ ප්‍රාදේශීය සභාවේ දී ය.

***ආදර්ශ අයදුම්පත්‍රය***

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගම්පහ ප්‍රාදේශීය සභාවේ .............................. තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම:———————————
මුලකරු වලින් හැඳින්වෙන නම් :———————————

2. ස්ථිර ලිපිනය :——————
3. උපන් දිනය වර්ෂය:——— මාසය:——— දිනය:———
අයදුම්පත් භාරගන්නා දිනට වයසඃ අවුරුදු:——— මාස:——— දින :———
4. ජාතික හැඳුනුම්පත් අංකය:——————
5. ස්ත්‍රී/පුරුෂ භාවය:——————
6. විවාහක/අවිවාහක තත්ත්වය:——————
7. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද?(පරම්පරාවෙන්ද නැතහොත් ලියාපදිංචියෙන්ද):——————
8. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල පිටපත් අමුණා එවන්න)

*(අ)* සමත් වූ වසර/ශ්‍රේණිය:——————
*(ආ)* අ.පො.ස. (සා/පෙළ) විභාගය :——————

| *(i)* *විභාග අංකය* | *(ii)* *වර්ෂය* |
|---|---|
| ______ | ______ |
| ______ | ______ |
| ______ | ______ |

9. ඔබ දැනටමත් ගම්පහ ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,
(i) දැනට දරන තනතුර :——————
(ii එම තනතුරට පත් වූ දිනය :——————
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා) පදනම මතද යන වග ඃ
10. වෘත්තීය සුදුසුකම් :——————
11. සේවා පළපුරුද්ද:——————
12. රියදුරු බලපත්‍රයේ වර්ගය සහ අංකය (රියදුරු තනතුරු සඳහා අදාළ වේ):——————
13. අයදුම්කරුගේ උස:——————
14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?:——————

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙම බඳවා ගැනීමෙහි කොන්දේසි අනුව මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර හෝ පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයට නුසුදුස්සකු සේ සලකා සේවයෙන් පහ කිරීමටත් යටත් බන බවද මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන

දිනය:——————

03-545

---

## විල්ගමුව ප්‍රාදේශීය සභාව

විල්ගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. විල්ගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වූ තනතුරු සඳහා ඉල්ලුම් කරන්නන් පහත සඳහන් පොදු සුදුසුකම් වලින් සමන්විත අයවලුන් විය යුතුයි.

01.01 *පොදු සුදුසුකම්*

*(අ)* ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි. මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි අයකු විය යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතුයි.

*(ආ)* තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. පළාත් පාලන ආයතනයක සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

*(ඉ)* අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු අතර, පත්වීම ලබා මාසයක් ඇතුළත නියමිත සුදුසුකම් ඇති වෛද්‍යවරයකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

*(ඊ)* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

*(උ)* රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු ය.

02. *පුරප්පාඩු පවතින තනතුරු*

02.01. රියදුරු - පුරප්පාඩු 02 (ශිල්පීය)

| *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* |
|---|---|
| රියදුරු III | රු. 12,470-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,860 (මාසික) |

*(1) සුදුසුකම් :*

*(අ)* අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 08 වන ශ්‍රේණිය/නවය වසර සමත් වී සිටිය යුතුයි.
*(ආ)* වාහන රියදුරකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුයි. (සහතික මගින් සනාථ කළ යුතුයි)
*(ඇ)* අවම උස අඩි 5 අඟල් 2 1/2 ක් විය යුතුයි.
*(ඈ)* දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.
*(ඉ)* මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.

*(II) වෘත්තීය සුදුසුකම් :*

පෞද්ගලික/කුලීරථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුයි. (බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අදාල සහතිකය ලබා සිටිය යුතුයි) (වාහන පන්ති සී සහ සී 1)

*02.02 කාර්යාල කාර්යය සහායක පුරප්පාඩු 01 (ශිල්පීය නොවන)*

| *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* |
|---|---|
| කාර්යාල කාර්යය සහායක III | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600(මාසික) |

(1) අධ්‍යාපන සුදුසුකම් .- දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.

*02.03 පුස්තකාල සහායක III - පුරප්පාඩු 03 (ශිල්පීය නොවන)*

| *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* |
|---|---|
| පුස්තකාල සහායක III | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (මාසික) |

(1) අධ්‍යාපන සුදුසුකම් .- දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.

*02.04 මාර්ග කම්කරු III - පුරප්පාඩු 01 (ශිල්පීය නොවන)*

| *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* |
|---|---|
| මාර්ග කම්කරු III | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (මාසික) |

(1) අධ්‍යාපන සුදුසුකම් .- දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.

*02.05 සෞඛ්‍ය කම්කරු III - පුරප්පාඩු 02 (ශිල්පීය නොවන)*

| *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* |
|---|---|
| සෞඛ්‍ය කම්කරු III | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (මාසික) |

(1) අධ්‍යාපන සුදුසුකම් .- අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය/ නවය වසර සමත් වී සිටිය යුතුයි.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* ඃ

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය
(ii) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(iii) පත්වීම් වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළ සතුටුදායක ලෙස සේවය නොකළහොත් පත්වීම ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.
(iv) ඉහත සඳහන් තනතුරුවලට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*04. බඳවාගැනීමේ පිළිවෙල* ඃ

(i) සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් බඳවා ගැනේ.
(ii) අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන සහතිකවල මුල්පිටපත් පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු වේ. එයට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්/තැපැල් ස්ථානාධිපති විසින් නිකුත් කළ හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් පරීක්ෂණ අවස්ථාවට ඉදිරිපත් කළ යුතුය.

(iii) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කරගන්නා ලද අයදුම්පත් 2013.03.28 වැනි දිනට පෙර "ලේකම්, විල්ගමුව ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(iv) අයදුම්පත් බහාලනු ලබන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අඩුපාඩු සහිත හෝ මෙම දැන්වීමේ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

05. සහතික පිටපත් .-
අයදුම්පත සමග පහත සඳහන් සහතික වල පිටපත් (මුල්පිටපත් නොවේ.) අමුණා එවිය යුතුය. (ඡායා පිටපත් වඩාත් සුදුසු වේ.) ඃ-

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) තමාගේ පදිංචිය තහවුරු කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනු අත්සන් කළ);
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එකක් තමා පදිංචි කොටසේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය);
(v) පළපුරුද්ද පිළිබඳ සහතික ඇත්නම් එම සහතික;
(vi) රියදුරු තනතුර සඳහා අයදුම්කරන්නන් රියදුරු බලපත්‍රයේ පිටපත.

06. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනසක් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල විල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

07. යම් අයදුම්කරුවෙකු තෝරාගන්නා පරිද්දෙන් කවර අන්දමකින් වුවද අයථා සංග්‍රහ පැතීම හෝ එහිලා බලපෑමක් කිරීමට තැත් කිරීම එම අයදුම්කරු නුසුදුස්සෙකු කිරීමට හේතු වනු ඇත.

ලේකම්,
විල්ගමුව ප්‍රාදේශීය සභාව.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***විල්ගමුව ප්‍රාදේශීය සභාව***

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**..............................තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. මුලකුරු සමග නම:——————————
2. මුලකුරු වලින් හැඳින්වෙන නම්:——————————
3. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
4. ස්ථිර පදිංචි ලිපිනය:——————————
5. තැපැල් ලිපිනය:——————————
6. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————
7. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:——————————
8. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය:——————————
9. උපන් දිනය:——————————
10. 2013.03.08 දිනට වයස:——————————

11. අධ්‍යාපන සුදුසුකම්:——————————
12. පළපුරුද්ද:——————————
13. වෘත්තීය සුදුසුකම්:——————————
14. වෙනත් සුදුසුකම් :——————————
15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කර තිබේද? යන වග :——————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැන ගැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමටත් බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමටත් යටත්වන බව හොඳාකාරවම දනිමි.

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————————

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන .....................මහතා /මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ......................වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් බළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

——————————
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————
තනතුර:——————————
දිනය:——————————

03-425

---

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* | *ශිල්පීය නිපුණතා/පළපුරුද්ද* |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු III | 01 | රු. 12,470-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,860 (PL 3 -2006 A) | *බාහිර අයදුම්කරුවන් සඳහා -* අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම ( A පන්තියේ) රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.<br><br>වාහන රියදුරු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 02 | විදුලි කාර්මික III | 01 | රු. 12,470-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,860 (PL 3 2006 A) | *බාහිර අයදුම්කරුවන් සඳහා -* අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | තනතුරේ කාර්යය භාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු |

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | ශිල්පීය නිපුණතා/පළපුරුද්ද |
|---|---|---|---|---|---|
| | | | | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | ආයතනයකින් නිකුත් කරන ලද NVQ 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය. පිළිගත් ආයතනයක අදාළ ක්ෂෙත්‍රයේ වසර 03 ක පළපුරුද්දක් තිබීම (සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 03 | වැඩ පරිපාලක III | 01 | රු. 12,210-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,600 (PL 2 - 2006 A) | *බාහිර අයදුම්කරුවන් සඳහා -* අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ NVQ 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම. |
| | | | | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | අදාළ ක්ෂෙත්‍රයේ පුහුණු කාලය හැර වසර 02ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 04 | නළ ලිං පොම්ප කාර්මික III | 01 | රු. 12,210-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,600 (PL 2 - 2006 A) | *බාහිර අයදුම්කරුවන් සඳහා -* අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය ක්ෂෙත්‍රය පිළිබඳ NVQ 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම. |
| | | | | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | අදාළ ක්ෂෙත්‍රයේ පුහුණු කාලය හැර වසර 02ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 05 | ඖෂධ සංයෝජක III | 03 | රු. 12,210-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,600 (PL 2 - 2006 A) | *බාහිර අයදුම්කරුවන් සඳහා -* අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ NVQ 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම. |
| | | | | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | අදාළ ක්ෂෙත්‍රයේ පුහුණු කාලය හැර වසර 02ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 06 | ආදාහනාගාර ක්‍රියාකරු III | 01 | රු. 12,210-10x130-10 x 145-10 x 160-12 x 170-රු. 18,600 (PL 2 - 2006 A) | *බාහිර අයදුම්කරුවන් සඳහා -* අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ NVQ 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම. |
| | | | | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | අදාළ ක්ෂෙත්‍රයේ පුහුණු කාලය හැර වසර 02ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | ශිල්පීය නිපුණතා/පළපුරුද්ද |
|---|---|---|---|---|---|
| 07 | ආදාහනාගාර සහායක III | 02 | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (PL 1 -2006 A) | අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | |
| 08 | කාර්යාල කාර්ය සහායක III | 02 | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (PL 1 -2006 A) | අ.පොස.(සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | |
| 09 | පුස්තකාල සහායක III | 01 | රු. 11,730-10x120-10 x 130-10 x 145-15 x 160-රු. 17,600 (PL 1 -2006 A) | අ.පොස.(සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | |
| 10 | වැඩ කම්කරු III | 10 | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (PL 1 -2006 A) | අ.පොස.(සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | |
| 11 | සෞඛ්‍ය කම්කරු III | 02 | රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු. 17,600 (PL 1 -2006 A) | රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | |

සැ. යු. - ඉහත තනතුරු සඳහා දැනටමත් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එම බඳවා ගැනීමේ දිනට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ කර ගනු ලැබේ.

02. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවය කරනු ලබන තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම් හා ස්ථිර අයගේ අයදුම්පත් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

03. *වයස :* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු අවු. 45ට නොවැඩි විය යුතුය.

(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

04. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්කරු ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 3 කට නොඅඩු කාලයක් තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ග්‍රාමනිලධාරී/ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය)
(iv) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහකරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතුය.
(vi) රියදුරු තනතුරු සඳහා -

(අ) අවම උස අඩි 05ක් විය යුතුය.
(ආ) දිවා කාලයේ දී හෝ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.
(ඇ) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.
(ඈ) පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය හා මාර්ග නීති පිළිබඳ පරීක්ෂණවලින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) පත්වීම අවුරුදු 03 පරිවාස කාලයකට යටත් වේ.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලට ද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

06. අයදුම්පත් .-
අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2013.03.22 වැනි දිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, වෙන්නප්පුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

06. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

07. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකපත්වල පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්‍ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සහතික;
(ඇ) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය/ඡන්ද හිමි නාමලේඛනයේ පිටපත;
(ඈ) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම සේවා නිලධාරියාගෙන් විය යුතුය.);
(ඉ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය.

08. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

කේ. පී. චන්දන කුමාර.
ලේකම්,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව*

*....................................තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
02. තැපැල් ලිපිනය:——————————.
03. උපන් දිනය ඃ
වර්ෂය:—————. මාසය:—————. දිනය:—————.
04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ
අවුරුදු:————. මාස:————. දින:—————.
05. විවාහක/අවිවාහක බව:——————————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
07. ජාතිය:——————————.
08. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචිවීමෙන්ද? යන වග :——————————.
09. අධ්‍යාපන සුදුසුකම්:——————————.
10. වෘත්තීය සුදුසුකම්:——————————.
11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,
(i) දැනට දරන තනතුර:——————————.
(ii) එම තනතුරට පත් වූ දිනය:——————————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම්) පදනම මතද?
12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?:——————————.

මෙහි සඳහන් මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන

දිනය:——————————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ....................මයා/මිය/මෙය මෙම ආයතනයේ ......................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ නිත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියා

අත්සන:——————————.
නම:——————————.
පදවිය:——————————.
දිනය:——————————.

03-424

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු - බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාතේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් ගෙන්, පුරප්පාඩු වී ඇති තනතුරු වලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2013.03.13 වැනි දිනට හෝ එදිනට පෙර " ලේකම්, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව, පානදුර පාර, බණ්ඩාරගම". යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි අයදුම්කරුවන්ට සහ මෙම සභාවේ දැනට අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂයෙන් සළකා බලනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *තනතුරු ගණන* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | සෞඛ්‍ය පරිපාලන II ශ්‍රේණිය | MN-1-2006A රු.13,120-145 x 10-170x11-240 x 10-320 x 10-රු.22,040 (ආරම්භක පියවර) | 01 | සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ස්වස්ථතාවය හා ශාරීරික විද්‍යාව/සෞඛ්‍ය විද්‍යාව/විද්‍යාව ඇතුළුව විෂයන් 05කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම;<br>*හෝ*<br>සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ස්වස්ථතාවය හා ශාරීරික විද්‍යාව/සෞඛ්‍ය විද්‍යාව/විද්‍යාව ඇතුළුව විෂයයන් 05කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා සිටින පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නකු ;<br>හෝ<br>පළාත් පාලන ආයතනයක අවුරුදු 10කට නොඅඩු අඛණ්ඩ ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 08 වැනි පන්තියේ සාමාර්ථය ලබා තිබීම. |

| අනු. අංකය | තනතුරු නාමය | වැටුප් ක්‍රමය | තනතුරු ගණන | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 02. | ආයුර්වේද බෙහෙත් කලවම්කරන්නා/ආයුර්වේද ඖෂධ සංයෝජන III ශ්‍රේණිය | PL-2-2006 A රු.12,210-130 x 10-145 x 10-160 x 10-170 x 12-රු.18,600 (ආරම්භක පියවර) | 03 | ජ්‍යෝෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 06කින් සාමාර්ථය ලබා තිබීම<br>නැතහොත්<br>ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 06කින් සාමාර්ථය ලබා තිබීම<br>සහ<br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ පිළිගත් රජයේ ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක කිසියම් තනතුරක වසරකට නොඅඩු කාලයක සේවා පලපුරුද්ද ලබා තිබීම. |
| 03. | යන්ත්‍ර ක්‍රියාකරු III ශ්‍රේණිය | PL-2-2006 A රු.12,210-130x10-145x10-160x10-170x12- රු.18,600 (ආරම්භක පියවර) | 02 | *බාහිර අයදුම්කරුවන් සඳහා -*<br>ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් කුමන හෝ විෂයයන් 02කින් සමත් වී තිබීම සහ තනතුරට අදාලව වසර දෙකක පළපුරුද්ද ලබා තිබිය යුතුය.<br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -*<br>අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වැනි වසර සමත්වී තිබීම සහ තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. |
| 04 | කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | PL-1-2006 A රු.11,730-120x10-130x10-145x10-160x12-රු.17,600 (ආරම්භක පියවර) | 03 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත්වී තිබිය යුතුය. |
| 05 | ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය | PL-2-2006A රු.12,210-130 x 10-145 x 10-160 x 10-170 x 12-රු.18,600 (ආරම්භක පියවර) | 01 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වී තිබීම සහ තනතුරට අදාලව වසර 02ක පළපුරුද්ද තිබිය යුතුය. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 06 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක III ශ්‍රේණිය | PL -1-2006 A රු.11,730-120 x 10-130 x 10-145 x 10 x 160 x 12 රු.17,600 (ආරම්භක පියවර) | 01 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත්වී තිබිය යුතුය. |
| 07 | පුස්තකාල උපස්ථායක/පුස්තකාල සහායක II ශ්‍රේණිය | PL-1-2006 A රු.11,730-120 x 10-130 x 10-145 x 10-160 x 12-රු.17,600 (12 පියවර) | 01 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී එක් වරකදී කවර හෝ විෂයයන් 06 සමත් වී තිබිය යුතුයි. |
| 08 | මුරකරු II ශ්‍රේණිය | PL -1-2006 A රු.11,730-120 x 10-130 x 10-145 x 10-160 x 12 රු.17,600 (12 පියවර) | 03 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී එක් වරකදී කවර හෝ විෂයයන් 06 සමත් වී තිබිය යුතුයි. |

| අනු. අංකය | තනතුරු නාමය | වැටුප් ක්‍රමය | තනතුරු ගණන | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 09 | වැඩ ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | PL -1-2006A රු.11,730-120 x 10-130 x 10-145 x 10-160 x 12-රු.17,600 (ආරම්භක පියවර) | 15 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබිය යුතුය. |
| 10 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | PL -1-2006A රු.11,730-120 x 10-130 x 10-145 x 10-160 x 12-රු.17,600 (ආරම්භක පියවර) | 09 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 11 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය (කොම්පෝස්ට් ඒකකය) | PL-1-2006A රු.11,730-120 x 10-130 x 10-145 x 10-160 x 12-රු.17,600 (ආරම්භක පියවර) | 08 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

ඉහත සඳහන් කරන ලද ඒ ඒ තනතුර සඳහා අදාල සුදුසුකම්වලට අමතරව පහත දැක්වෙන පොදු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

*01. පොදු සුදුසුකම් :*

(i) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වර්ෂ 03ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. (බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් සහතික කරනු ලබන ග්‍රාම නිලධාරි සහතිකයකින් සනාථ විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2013.03.13 වන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(iii) අයදුම්කරු යහපත්/විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(v) අයදුම්කරු පරම්පරාවෙන්, ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(vi) ඉල්ලුම් පත් භාර ගැනීමේ අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05ක කාලය තුල වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නොමැත්තා වූද සතුටුදායක සේවා කාලයක් සපුරන අයෙකු විය යුතුය.

(vii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින් තනතුරු සඳහා අයදුම් කිරීමේදී, රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල/සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.

*02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන්නේය/ශ්‍රේණිගත උසස් වීමක් නම් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාල සීමාවකට යටත් විය යුතුය.

(iii) ඉහත තනතුරු යටතේ බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත් දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(vi) මෙම සේවයේ සේවකයින් ස්ථාන මාරුකිරීම් වලට යටත් වේ. පළාත් පාලන ආයතන තුල ස්ථාන මාරු කිරීමේ බලය ඒ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රධානියා සතුවේ. තවද පළාත්පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම් ඒ ඒ පළාත් ආයතන වල ප්‍රධානීන්ගේ

එකගතාවය මත පළාත් පාලන කොමසාරිස් විසින් සිදු කරනු ඇත. රාජකාරි වේලාව හා රාජකාරියේ යෙදවීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ප්‍රධානියාට රජය පිළිගත් නීතිරීති වලට යටත්ව තීරණය කළ හැකි වේ.

(v) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට ද රජය හෝ පළාත් සභාව හෝ දෙපාර්තමේන්තු නියෝග වලටද වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව ක්‍රියා කිරීමට පත්වීම් ලාභීන් බැඳී සිටිය යුතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) බඳවා ගැනීමේ පරිපාටියට අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයක ප්‍රතිඵල මත හෝ අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයක කුසලතාවය මත සුදුසුකම් ලබන අයව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් සුදුස්සන් තෝරා ගැනේ.

(ii) බඳවා ගැනීමේ පරිපාටින්ට අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් නොමැති තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

*04. අයදුම්කිරීමේ ක්‍රමය :*

(i) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික පත්‍රවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළයුතුය.

(1) උප්පැන්න සහතිකය;
(2) ජාතික හැඳුනුම්පතේ පිටපත;
(3) මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි;
(4) වෘත්තීය හෝ පළපුරුද්ද සනාථ කෙරෙන ලියවිලි;
(5) තම පදිංචිය සනාථ කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය.

(ii) මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(iii) අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ බඳවා ගැනීමට නියමිත තනතුරු සංඛ්‍යාව සංශෝධනය/තීරණය කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ බලතල බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

(iv) සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා රා. ප. ච. ලේ. 15/90 ප්‍රකාරව ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ප්‍රමුඛතා ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ලක්කර සුදුසුකම් පරීක්ෂා කෙරේ.

*සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා ලිඛිත පරීක්ෂණය -*

(අ) සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා පැය 1, 1/2 ක ප්‍රශ්න පත්‍රයක්
(ආ) සාමාන්‍ය දැනුම පරීක්ෂා කරන පැය 01ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

(v) අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහල කෙලවරේ අයදුම්පත් යොමුකරන තනතුර, *ගැසට් නිවේදනයේ* සඳහන් පරිදි පැහැදිලිව සටහන් කළ යුතුය. අසම්පූර්ණ හා 04 ඡේදයේ I යටතේ සඳහන් සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත දිනට (2013.03.13 දිනට) පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එන්. ඩී. අයි. ස්වර්ණා කේ. පෙරේරා,
ලේකම්,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 15 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව,
පානදුර පාර,
බණ්ඩාරගම.

ආදර්ශ අයදුම්පත්‍රය

**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව**

***................................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ නම මුලකුරු සමඟ :———————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම්:———————.
03. ස්ථිර ලිපිනය:———————.
04. ජාතික හැඳුනුම්පත් අංකය:———————.
05. උපන්දිනය : වර්ෂය:———————, මාසය:———————, දිනය:———————.
06. අයදුම්පත් භාර ගන්නා 2013.03.13 දිනට වයස : අවුරුදු :———————, මාස:———————, දින:———————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය:———————.
08. විවාහක/අවිවාහක බව:———————.
09. ජාතිය:———————.
10. ඔබ දැනටමත් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් දරන තනතුර :———————.සේවා කාලය:———————. එම පත්වීම ස්ථිරද/තාවකාලිකද/අනියම්ද/කොන්ත්‍රාත්ද යන වග:———————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද යන වග:———————.
12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.):———————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්:———————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

———————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————.

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ........................................ මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම ආයතනයේ (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) පදනම මත .............................. දින සිට .............................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම් කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

———————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :———————.
තනතුර:———————.
දෙපාර්තමේන්තුව:———————.
නිල මුද්‍රාව:———————.
දිනය:———————.

03-398

---

## සංශෝධනයයි

**බේරුවල ප්‍රාදේශීය සභාව - අළුත්ගම**

2013.02.22 වැනි දින පළකරන ලද අංක 1,799 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටස - පළාත් පාලනය - තනතුරු ඇබෑර්තු යටතේ, ඉහත සඳහන් ප්‍රාදේශීය සභාව යටතේ පළකරන ලද නිවේදනයේ පළමු ඡේදයේ "අගලවත්ත ප්‍රාදේශීය සභා බලසීමාව තුළ" යන වචන ඉවත් කර "බේරුවල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ" යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

ඒ. එස්. එන්. ද සිල්වා,
ලේකම්,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2013 පෙබරවාරි මස 26 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-657

# පළාත් පාලන නිවේදන

## අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වැනි වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. දිනේෂ් ගුණරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව අරණායක.

2013 පෙබරවාරි මස 14 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය 01

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | වේරගොඩ ප්‍රධාන මාර්ගයේ සිට ගැරිපත්ගම ගම කෙලවර අතුරු මාර්ගය |
| මාර්ගයේ ආරම්භය හා අවසානය | :- | වේරගොඩ ප්‍රධාන මාර්ගයේ සිට ගැරිපත්ගම ගම කෙලවර අතුරු පාර දක්වා |
| ග්‍රාම සේවා වසම හා අංකය | :- | අංක 45, දිප්පිටිය. |
| මාර්ගයේ දිග | :- | මීටර් 73 පළල අඩි 08 |

*වම :*

01. පී. පී. පිංහාමි මයා, එපිටවත්ත ඉඩම
02. ජී. එම්. පොඩි මැණිකේ මිය, එපිටවත්ත ඉඩම

*දකුණ :*

01. ජී. ජී. පියසේන මයා, එපිටවත්ත ඉඩම
02. ජී. එම්. පොඩි මැණිකේ මිය, එපිටවත්ත ඉඩම

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | බැම්ණිවත්ත වලව්වත්ත හරහා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය හා අවසානය | :- | බැම්ණිවත්ත ගොවිජනසේවා මධ්‍යස්ථානය අසලින් දිවෙන මාවනැල්ල ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයෙන් ආරම්භව පහල වලව්වත්ත ඉඩමේ මායිම දක්වා |
| ග්‍රාම සේවා වසම | :- | 33/සී රුවන්දෙනිය |
| මාර්ගයේ දිග | :- | මීටර් 215 පළල අඩි 08 |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම් පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | |
|---|---|
| 01. එස්. එම්. ඩබ්. මැකීම් මයා | පතගිගොල්ලහේන |
| 02. ඩබ්. එස්. පී. කේ. වේරහැර මයා | පතගිගොල්ලහේන |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | |
|---|---|
| 01. එස්. එම්. ඩබ්. මැකීම් මයා | පතගිගොල්ලහේන |
| 02. එස්. එම්. ඩබ්. මැකීම් මයා | වලව්වේවත්ත |
| 03. පී. එම්. වික්‍රමසේකර මයා | වලව්වේවත්ත |

බලයලත් මිනින්දෝරු එච් එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ දිනැති අංක 6365 දරන පිඹුරුපත පරිදියි.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | කොටුගොඩැල්ල සිට පල්ලේපමුණුව ගම මැදට යන මාර්ගය |
| මාර්ගයේ ආරම්භය හා අවසානය | :- | කොටුගොඩැල්ල (අළුපත හිගුල මාර්ගය) සිට ගමමැද වෙල්යාය |
| ග්‍රාම සේවා වසම හා අංකය | :- | අංක 33, රුවන්දෙනිය |
| මාර්ගයේ දිග | :- | මීටර් 452.2 පළල අඩි 10 |

වම :

01. එච්. පී. සී. ජාලිය කීර්තිරත්න මයා, අඹගහදෙණිය ඉඩම
02. එච්. පී. රන්ජිත් තිලකරත්න මයා, අඹගහදෙණිය ඉඩම
03. එච්. පී. නාලනී තිලකරත්න මයා, අඹගහදෙණිය ඉඩම
04. ඒ. පී. එස්. එන්. අජිත් කුමාර මයා, කොයිලවත්ත ඉඩම
05. යූ. ජී. ප්‍රේමදාස මයා, කොයිලවත්ත ඉඩම
06. එච්. ජී. එල්. සමරසිංහ මයා, කොයිලවත්ත ඉඩම
07. එච්. ජී. සේනාරත්න මයා, පන්සල් වත්ත ඉඩම
08. එච්. පී. නාලනී සේනාරත්න මිය, බෙරාවත්ත ඉඩම
09. එච්. පී. ගුණරත්න මයා, ළිඳමුල වත්ත ඉඩම
10. එච්. ජී. නාලනී සේනාරත්න මිය, බෙරාවත්ත ඉඩම

දකුණ :

01. එච්. පී. සමරසිංහ මයා, පිටදෙනිය ඉඩම
02. එච්. පී. බී. ස්වර්ණලතා මිය, කොයිලවත්ත ඉඩම
03. ජී. ආර්. පුංචිබණ්ඩා මයා, ජී. ආර්. ටිකිරිබණ්ඩා මයා, ජී. ජයවර්ධන මයා, නොනාවත්ත ඉඩම
04. ඩී. පී. චන්ද්‍රාණි මල්ලිකා මිය, එපිටහකොටුව ඉඩම
05. එච්.පී. සුගතදාස මයා, අරඹවත්ත ඉඩම
06. එච්. පී.එන්. උදය කුමාර මයා, එච්. පී. සුනිල් ප්‍රේමරත්න මයා, පරගහමුලවත්ත ඉඩම
07. එච්. පී. ධර්මදාස මයා, පරගහමුල වත්ත ඉඩම
08. එච්. පී. සෙනවිරත්න මයා, පරගහමුලවත්ත ඉඩම

| | |
|---|---|
| මාර්ගයේ නම | :- තෙල් එක නැගෙනහිර අතුරු මාර්ගය |
| මාර්ගයේ ආරම්භය හා අවසානය | :- එච්. ජී. සෙනවිරත්න මහතාගේ පාරේ සිට එන්. ගුණසේකර මහතාගේ පාර දක්වා |
| ග්‍රාම සේවා වසම හා අංකය | :- අංක 41බී, තෙල් එක |
| මාර්ගයේ දිග | :- මීටර් 270 පළල අඩි 08 |

වම :

01. එච්. කේ. සෙනවිරත්න මයා, කඩේවත්ත
02. එච්. පී. රොසලින් නොනා මිය, වලව්වේ වත්ත
03. එන්. දයා මැණිකේ මිය, වලව්වේ වත්ත
04. එන්. සෝමපාල මයා, වලව්වේ වත්ත
05. එන්. සිරිසේන මයා, වලව්වේ වත්ත
06. එන්. ගුණසේකර මයා, උනිදියාවේ වත්ත

දකුණ :

01. එන්. ධර්මසිරි මයා, හිටිනාවත්ත
02. එන්. නන්දසේන මයා, හිටිනාවත්ත
03. එන්. දිසානායක මයා, උනිදියාවේ වත්ත
04. එන්. ටී. පියසේන මයා, උනිදියාවේ වත්ත
05. ටී, කේ. අමරසේන මයා, වලව්වේ වත්ත
06. එන්. සෝමපාල මයා, වලව්වේ වත්ත
07. එන්. ගුණසේකර මයා, උනිදියාවේ වත්ත

| | |
|---|---|
| මාර්ගයේ නම | :- මේනම උඩමුදුනේහේන මාර්ගය |
| මාර්ගයේ ආරම්භය හා අවසානය | :- දිප්පිටිය සිට වේරගොඩ මාර්ගයේ උඩුමුදුනේහේන ඉඩම අසලින් ආරම්භව ජේ. එම්. හේරත් බණ්ඩා මහතාට අයත් උඩුමුදුනේහේන ඉඩමෙන් අවසන් වෙයි. |
| මාර්ගයේ දිග | :- මීටර් 190 පළල අඩි 12<br>අඩි 14 |
| ග්‍රාම නිලධාරි වසම | :- දිප්පිටිය 45 |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | | |
|---|---|---|
| 01. | එම්. ආර්. චම්පිකා අනෝමා කුමාරි මිය | උඩුමුදුනේහේන |
| 02. | එම්. ආර්. විජිත දර්මකීර්ති මයා | උඩුමුදුනේහේන |
| 03. | එම්. ආර්. රංබණ්ඩා මයා | උඩුමුදුනේහේන |
| 04. | එම්. ආර්. ටිකිරි බණ්ඩා මයා | උඩුමුදුනේහේන |
| 05. | ජේ. එම්. හේරත් බණ්ඩා මයා | උඩුමුදුනේහේන |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | | |
|---|---|---|
| 01. | එම්. ආර්. චාර්ලිස් බණ්ඩා මයා | උඩුමුදුනේහේන |
| 02. | ඩබ්. ආර්. අමිත උපනන්ද බණ්ඩාර මයා | උඩුමුදුනේහේන |
| 03. | එම්. ආර්. විජේරත්න බණ්ඩා මයා | උඩුමුදුනේහේන |
| 04. | එම්. ආර්. පද්මිණී කුමාරි මිය | උඩුමුදුනේහේන |
| 05. | ඩී. ආර්. ලොකුබණ්ඩා මයා | උඩුමුදුනේහේන |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ අංක දරන 2011.07.15 දිනැති පිඹුරුපත පරිදියි.

| | |
|---|---|
| මාර්ගයේ නම | :- බුවැලිකඩ සැලව මාර්ගයේ දෙල්කුඹුර ඉඩමේ සිට ගුරුවා වත්ත පාසල දක්වා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය හා අවසානය | :- බුවැලිකඩ සැලව මාර්ගයේ දෙල්කුඹුරේ සිට ගුරුවාවත්ත බුවැලිකඩ ගැමුණු විද්‍යාලය දක්වා |
| ග්‍රාම සේවා වසම හා අංකය | :- අංක 41, රහල |
| මාර්ගයේ දිග | :- මීටර් 170 පළල අඩි 08 |

*වම :*

01. ආර්. පී. දිල්හානී අමරසේකර මිය, දෙල්කුඹුර ඉඩම
02. ඩී. ඩබ්ලිව්. ජී. ගුණතිලක බණ්ඩා මයා, දෙල්කුඹුර පිල්ලෑව

*දකුණ :*

01. කේ. සුගතපාල මයා, කපුටාදෙනිය කුඹුර
02. කේ. බී. ජී. සුරේෂ් කුමාර සේනාරත්න මයා, ගුරුවාගේ වත්තේ හේන
03. එම්. මහින්ද ශ්‍රී අබේසිංහ මයා,
04. කෑ/මාව/ගැමුණු ප්‍රාථමික විද්‍යාලය (ගුරුවාවත්ත පාසල පිහිටි ඉඩම, ගුරුවාවත්තේ හේන)

03-462

---

**බිංගිරිය ප්‍රාදේශීය සභාව - බිංගිරිය**

මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් විලත්තව සතිපොල ඉදිරිපිට ඇති "ධර්ම විජය මාවත" නමින් භාවිතා කරන ලද මාර්ගය "බක්මී රුප්පේ ධම්මතිලක නා හිමි මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2012.07.26 වැනි දින පැවති මාසික සභා රැස්වීම අංක 06-1 දරන යෝජනාව පරිදි වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් ඉහත සඳහන් මාර්ගය "බක්මීරුප්පේ ධම්මතිලක නා හිමි මාවත" යනුවෙන් 2013.01.16 වැනි දින සිට නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඊ. එම්. දිමුත් තුෂාර ඒකනායක,
සභාපති,
බිංගිරිය ප්‍රාදේශීය සභාව,
බිංගිරිය.

2013 ජනවාරි මස 30 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලය,
බිංගිරිය.
03-468

**හම්බන්තොට මහ නගර සභාව**

මහ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාව

හම්බන්තොට මහ නගර සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 09 වැනි දින පවත්වන ලද විශේෂ සභා රැස්වීමේ දී තීරණ අංක 05 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහ නගර සභාව.

2013 ජනවාරි මස 10 වැනි දින,
හම්බන්තොට මහ නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (අතුරු සම්මත ව්‍යවස්ථා) පනතෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් කෙටුම්පත් කර 1989 ජනවාරි මස 20 වැනි දින අංක 541/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරනු ලැබ සහ දකුණු පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරනු ලබූ බවට 1991 පෙබරවාරි මස 01 වැනි දින අංක 648 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති මහ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල 01 වැනි කොටසේ සිට 57 වැනි කොටස දක්වා කොටස්වල දැක්වෙන අතුරු ව්‍යවස්ථා හම්බන්තොට මහ නගර සභාව විසින් පිළිගනු ලැබිය යුතු බවත් එසේ පිළිගත් සම්මත අතුරු ව්‍යවස්ථා හම්බන්තොට මහ නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බවත් හම්බන්තොට මහ නගර සභාව යෝජනා කරන්නීය."

03-469

---

**සම්මත අතුරු ව්‍යවස්ථා**

මැදගම ප්‍රාදේශීය සභාව

261 අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මැදගම ප්‍රාදේශීය සභාව විසින් 2012.12.28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 07.03 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 24 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2012.10.05 වැනි දින අංක 1778/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ප්‍රාදේශීය සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා, මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මැදගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

03-318/1

---

**සම්මත අතුරු ව්‍යවස්ථා**

මැදගම ප්‍රාදේශීය සභාව

261 අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මැදගම ප්‍රාදේශීය සභාව විසින් 2012.12.28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 07.04 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 24 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.11.02 වැනි දින අංක 1678/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා, මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මැදගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

03-318/2

---

**මනිමුනේ නිරිත ප්‍රාදේශීය සභාව**

මනිමුනේ නිරිත ප්‍රාදේශීය සභා මායිම් සීමාවලට අදාළ පහත සඳහන් ප්‍රදේශ සංවර්ධනය වූ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීම

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය අනුව මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති පහත සඳහන් වගුවේ සඳහන් ගම්මාන සංවර්ධනය වූ ගම්මාන ලෙස ප්‍රකාශයට පත් කිරීමට 2012.10.26 වැනි දින පැවත්වූ 58 වැනි සභා රැස්වීමේ දී 4 වැනි තීරණය ලෙස සම්මතකර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ගම්මාන* | *ග්‍රාම නිලධාරි වසම* | *ග්‍රාම නිලධාරි වසමේ අංකය* |
|---|---|---|
| කොක්කට්චෝලේ | 01. කොක්කට්චෝලේ | 134 |
| | 02. කොක්කට්චෝලේ දකුණ | 134A |
| මහිලඩිතිවූ | 01. මහිලඩිතිවූ | 129A |
| | 02. මහිලඩිතිවූ දකුණ | 129B |
| මුදලයිකුඩා | 01. මුදලයිකුඩා | 131 |
| | 02. මුදලයිකුඩා බටහිර | 131 A |
| මුනයිකාඩු | 01 මුනයිකාඩු නැගෙනහිර | 133 |
| | 02. මුනයිකාඩු බටහිර | 133 A |
| | 03. මුනයිකාඩු දකුණ | 133 B |
| | 04. මුනයිකාඩු උතුර | 133 C |
| අරසඩිතිව් | 01. අරසඩිතිව් | 128 |
| | 02. අරසඩිතිව් උතුර | 128 C |
| කඩුක්කාමුනේ | 01. කඩුක්කාමුනේ | 128 A |
| පට්ටිපල | 01. පට්ටිපල | 128 B |
| අම්පිලාන්තරයි | 01. අම්පිලාන්තුරයි | 127 |
| | 02. අම්පිලාන්තුරයි බටහිර | 127 A |
| | 03. අම්පිලාන්තුරයි දකුණ | 127 B |
| පත්මාරියාවේලි | පන්ඩාරියාවෙලි | 129 |

ටී. පෙරින්පරාසා,
සභාපති,
මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාව,

කොක්කට්චෝලේ.

03-269

---

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

2013 වසර සඳහා ගවමස් අලෙවිසැල් හා ගෝඝාතකාගාර සඳහා බලපත්‍ර ලබා දීම

2013 වසර සඳහා පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් උපලේඛන 1 හි සඳහන් ස්ථානවල ගවමස් අලෙවි සැල් හා ගෝඝාතකාගාර ස්ථාපිත කිරීමට යෝජිත බැවින්, බල ප්‍රදේශයේ පදිංචි යම් අයෙකුගේ විරෝධතාවයක් වේ නම් එම විරෝධතාවය මා වෙත පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බවත්, ගෝඝාතන ආඥාපනතේ 7(2) ආ උපවගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

කේ. එස්. බී. රාජනායක,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 12 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *ලිපිනය* |
|---|---|---|
| 1 | එම්. එම්. තාරික් | උඩුදෙණිය, මඩිගේ, මාරස්සන |
| 2 | අබ්දුල් රහිම් නසාර් | නිවාස 16. බෝපිටිය පාර, දෙල්තොට |
| 3 | එම්. එස්. මුෆස්සිර් මුහම්මද් | පල්ලේගම, දෙල්තොට |
| *ගෝඝාතකාගාර* | | |
| 1 | එම්. එම්. තාරික් | උඩුදෙණිය, මඩිගේ, මාරස්සන |
| 2 | ජේ. ජෙලීල් | පට්ටයගම, පල්ලේගම, දෙල්තොට |

03-323/2

---

**කටාන ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙම පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් වන ස්ථානයන් හි දී 2013 වර්ෂයේ දී ගෝඝාතකාගාර පැවැත්වීමට සහ ගවමස්, ඌරුමස්, එළු මස් වෙළඳාම්කරගෙන යාම සඳහා බලපත්‍ර ලබාගැනීමට ඉදිරිපත් වී ඇති බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කටාන ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධවන්නේ කුමන කාරණයක් සඳහාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

පී. ලීලානන්ද සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභා කාර්යාලය.

| | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ස්ථානය* | *වෙළඳාම/ව්‍යාපාරය* |
|---|---|---|---|
| 01. | කේ. ලිලානි ධම්මිකා මිය<br>අංක 21, කෝන්ගොඩමුල්ල, කටාන | කදිරාන, අක්කර පනහ | ගවමස්/ඌරු මස් |
| 02. | ඒ. ඒ. ඩී. සුමිත් අසංක මහතා,<br>අංක 69/4, කයිතානු මාවත, කොටුගොඩ | කොටුගොඩ, ජාඇල පාර | ගවමස්/ඌරු මස් |
| 03. | ආර්. එම්. මේරි මාග්‍රට් මිය<br>අංක 485/3, කෝන්ගොඩමුල්ල, කටාන | කිඹුලපිටිය<br>දාගොන්න පාර | ගවමස්/ඌරු මස් |
| 04. | එම්. රෝස් ප්‍රනාන්දු මිය, අංක 5/3,<br>ෆ්‍රැන්ක්ලින් මාවත,<br>ආඬිඅම්බලම, කටාන | නැ/කටාන ගිරිඋල්ල පාර | ගවමස් /ඌරුමස් |
| 05. | එම්. එස්. එම්. රියාස් මහතා,<br>අංක 12, අසික් ෆරීඩ් මාවත,<br>පෙරියමුල්ල, මීගමුව | මහ හුණුපිටිය | ගවමස් |
| 06. | රනිල් රොෂාන් මහතා, අංක 555/7/බී<br>ලියෝමාවත, කෝන්ගොඩමුල්ල, කටාන | ආඩිඅම්බලම<br>මිනුවන්ගොඩ පාර | ඌරු මස් |
| 07. | එම් හනීෆා මහතා,<br>අංක බී/147, ගල්ඔළුව, මිනුවන්ගොඩ | ආඬිඅම්බලම<br>මිනුවන්ගොඩ පාර | ගව මස් |
| 08. | ප්‍රියන්ති මංජුලා මිය, 521/2 ලියෝ<br>මාවත, කෝන්ගොඩමුල්ල, කටාන | කොන්දගම්මුල්ල, මීරිගම පාර | ඌරු මස් |
| 09. | ආර්. එම්. මාකස් ෆොන්සේකා මහතා<br>ලියෝ මාවත, කෝන්ගොඩමුල්ල, කටාන | කොන්දගම්මුල්ල, මීරිගම පාර | ගව මස් |

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ස්ථානය* | *වෙළඳාම/ව්‍යාපාරය* |
|---|---|---|
| 10. ඒ. එස්. ජී. එස් ප්‍රනාන්දු මහතා අංක 275, කොන්දගම්මුල්ල, දෙමංහන්දිය | කඳවල අංක 02 ගිරිඋල්ල පාර | ගවමස්/ඌරු මස් |
| 11. එස්. එල්. අන්තෝනි පුල්ලේ මහතා අංක 68/1, මායිම් පාර, වැලිහේන කොච්චිකඩේ. | වැලිහේන අංක 02 අඩි 60 පාර | ගවමස්/ඌරු මස් |
| 12. ඒ. පී. ජෝශප් සරත් මහතා, අංක 56/3 රංජිත් මධුරාවල පාර, කෝන්ගොඩමුල්ල කටාන | කටුවපිටිය, පල්ලිය අසල | ඌරු මස් |
| 13. ටී. ස්ටීවන් පෙරේරා මහතා ඇත්ගාල, කඳවල, කටාන | ඇත්ගාල අංක 02, වැලිහේන පාර | ගවමස්/ඌරු මස් |
| 14. ලලිත් ප්‍රිය ශාන්ත මහතා, අංක 71/ඒ නෑ. කළුවාරිප්පුව, කටාන. | දූරියන්ගස් හංදිය | ගවමස්/ඌරු මස් |
| 15. ඒ. ජෝශප් ඇන්ටනී ප්‍රනාන්දු මහතා, අංක 124/ඒ බම්බුකුලිය කොච්චිකඩේ. | බම්බුකුලිය අංක 01 | ගවමස්/ඌරු මස් |
| 16. එම්. එස් හුසේන් මහතා, අංක 73, සෙන්ට්‍රල් ගාඩ්න්ස්, කුස්වල, රද්දොළුව | රද්දොළුව නි. යෝ. ක්‍රමය 2 එම් 5 | ගවමස් |
| 17. එම්. ආර්. ආර්. සිල්වා මහතා දෙල්ගස්හංදිය, කටාන | ගිරිඋල්ල පාර,බ/කටාන | ගවමස්/ඌරු මස් |
| 18. ජේ. ඕ. එස්. ප්‍රනාන්දු පීඤ්ඤ මහතා, අංක 175/1, හලාවත පාර, මානවේරිය | හලාවත පාර, මානවේරිය | ගවමස්/ඌරු මස් |
| 19. ඒ. ආර්. සී. පෙරේරා මහතා, අංක 155/129, ගැමුණු මාවත, පීල්ලවත්ත, ආඬිඅම්බලම | මීනුවන්ගොඩ පාර, ආඬිඅම්බලම කේ. ඩී. එම්. එස්. පෙරේරා මහතාගේ ඉඩම | ඌරු මස් |
| 20. ටී. ජේ. ඇන්ටනී පෙරේරා මහතා, අංක 275/8, පහල කඳවල, තිඹිරිගස්කටුව | අංක 73, ජයමාවත, කඳවල | ගවමස්/ඌරු මස් |
| 21. ජේ. ඕ. එස්. ප්‍රනාන්දු පීඤ්ඤ මහතා, අංක 175/1, හලාවත පාර, මානවේරිය | හලාවත පාර, මානවේරිය | ගෝඝාතකාගාරය |
| 22. එම්. එස්. එම්. රියාස් මහතා අංක 12, අෂික් පරීඩ් මාවත, පෙරියමුල්ල, මීගමුව. | මහිමගොඩැල්ලවත්ත මහහුණුපිටිය | ගෝඝාතකාගාරය |

03-370

# විවිධ දැන්වීම්

**මහරගම නගර සභාව**

විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම - 2013

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනත යටතේ 2(1) වගන්ති ප්‍රකාරව (267 අධිකාරය) මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ සෑම චිත්‍රපටි සංදර්ශනයක් (සිනමා ශාලාවල හැර) ආධාර චිත්‍රපට සංදර්ශණයක්, සර්කස් සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, ගායනයක්, සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක්, ක්‍රීඩාවක් සඳහාම මුද්‍රණය කරන ලද ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 10% (සියයට දහයක්) විනෝද බද්දක් 2013.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි ගෙවිය යුතුයි.

**උපලේඛනය**

මීට අමතරව (176 වගන්තිය) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ ඉහත විනෝද කටයුතු ඇතුලත්ව වේදිකා නාට්‍ය, නෘත්‍ය, රූකඩ, මුද්‍රා නාට්‍ය සඳහා රු. 500ක බලපත්‍ර ගාස්තුවක් ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

03-377/7

---

**මහරගම නගර සභාව**

සේවා ගාස්තු 2013

**සභාව සතු බිම්, තාවකාලිකව වෙළඳ කටයුතු සඳහා බදු දීම**

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි සභාව සතු බිම්, තාවකාලිකව බදු දීමේ ගාස්තු 2013.01.01 වැනි දින සිට පනවා අය කිරීමට 2012.11.29 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීම් අංක 06(01) යටතේ සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | *රු. ශ.* |
|---|---|
| අඩි 10x10 සිට අඩි 10x25 දක්වා ප්‍රමාණයේ තාවකාලික වෙළඳ කුටියක් සඳහා දිනකට | 1,000 0 |
| අඩි 10x25 සිට අඩි 10x50 දක්වා ප්‍රමාණයේ තාවකාලික වෙළඳ කුටියක් සඳහා දිනකට | 2,500 0 |
| අඩි 10x50 වැඩි ප්‍රමාණයක තාවකාලික වෙළඳ කුටියක් සඳහා දිනකට | 5,000 0 |

03-377/6

---

**මහරගම නගර සභාව**

ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අය කිරීම - 2013 වර්ෂය

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ අංක 162(1)(ආ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මහරගම නගර සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, මාවතකට, හෝ අහසට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරු, බැනර් හා ප්‍රචාරක කටවුට්, වෙනුවෙන් 2013 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කිරීමට මහරගම නගර සභාව තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2012 දෙසැම්බර් මස 20 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | රු. ශ. |
|---|---|---|
| (1) | බැනර් වර්ග අඩියකට (එක් මාසයකට හෝ අඩු කාලයක් සඳහා) | 30 0 |
| (2) | ප්‍රචාරක කටවුට් වර්ග අඩියකට (එක් මාසයකට හෝ අඩු කාලයක් සඳහා) | 50 0 |
| (3) | ස්ථිර දැන්වීම් පුවරු වර්ග අඩියකට (එක් වර්ෂයකට) | 100 0 |
| (4) | ස්ථිර දැන්වීම් පුවරු (එල්. ඊ. ඩී.) | 250 0 |
| (5) | සභාව සතු දේපලවල, භූමිවල දැන්වීම් පුවරු සවි කිරීම සඳහා ප්‍රදර්ශන ගාස්තුවට අමතරව සභාව විසින් තීරණය කරනු ලබන බිම් බද්දක් අය කෙරේ. | |
| (5) | නගර සභා මගින් ඉවත් කරන ලද බැනර් හා ප්‍රචාරක දැන්වීම් පුවරු ආපසු ලබා දීම සඳහා අය කරන ගාස්තු | |
| | *(අ)* එක් බැනරයක් සඳහා | 60 0 |
| | *(ආ)* එක් දැන්වීම් පුවරුවක් සඳහා | 750 0 |

03-377/4

---

**මහරගම නගර සභාව**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු - 2013 වර්ෂය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය පරිදි මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ ඇති කරනු ලබන සෑම බල්ලෙකු හා බැල්ලියක වෙනුවෙන් 2013 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කිරීමට මහරගම නගර සභාව තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2012 දෙසැම්බර් මස 20 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | රු. ශ. |
|---|---|---|
| (1) | සෑම බල්ලෙකු සඳහාම | 5 0 |
| (2) | සෑම බැල්ලියක සඳහාම | 7.50 |

03-377/5

---

**මහරගම නගර සභාව**

රථ වාහන නැවැත්වීම සඳහා ගාස්තු

නගර සභා ආඥා පනතේ (255 වැනි අධිකාරය) 162(1) 163(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර 2010 ක් වූ මැයි මස 14 වැනි දින IV (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුනා වූ සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව, 2013 වර්ෂයට මහරගම නගර සභා සීමාව තුළ නම් කර ඇති රථ වාහන නවතා තබන ස්ථාන වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි බදු පනවා අය කිරීමට මහරගම නගර සභාව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2012 දෙසැම්බර් මස 20 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

**"අ" උපලේඛනය**

| *අංකය* | *වාහන වර්ගය* | *පළමු පැය හෝ ඉන් ඉතිරි කොටසක් සඳහා ගාස්තුව රු. ශත* | *වැඩිවන සෑම අතිරේක පැයක් සඳහා ගාස්තුව රු. ශත* |
|---|---|---|---|
| 01. | පාපැදියක් සඳහා | 5 0 | 2 0 |
| 02. | යතුරු පැදියක් සඳහා | 10 0 | 5 0 |
| 03. | මෝටර් කාරයකට | 20 0 | 10 0 |
| 04. | බස් රථයක් හෝ ලොරියක් සඳහා | 100 0 | 20 0 |
| 05. | වෑන් රථයක් හෝ වෙනත් මෝටර් වාහනයක් සඳහා | 30 0 | 10 0 |
| 06. | ත්‍රී රෝද රථයක් සඳහා | 15 0 | 5 0 |

03-377/3

**මහරගම නගර සභාව**

රථ වාහන හා සත්ත්ව බදු - 2013 වර්ෂය

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) අංක 162(1) (ආ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර 2013 වර්ෂයට රථ වාහන හා සතුන් වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි බදු පනවා අය කිරීමට මහරගම නගර සභාව තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2012 දෙසැම්බර් මස 20 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| 1. | මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක්, හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | 25 0 |
| 2. | සෑම බයිසිකලයක්, ට්‍රයිසිකලයක්, හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක්, ට්‍රයිසිකලයක් කරත්තයක් සඳහා - | |
| | (i) එය වෙළඳ කටයුතු සඳහා භාවිතා කරන්නේ නම් | 10 0 |
| | (ii) එය වෙළඳ කටයුතු නොවන කාර්යයක් සඳහා පාවිච්චි කරන්නේ නම් | 5 0 |
| 3. | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| 4. | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| 5. | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| 6. | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටලුවෙකු සඳහා | 15 0 |
| 7. | සෑම අලියෙකු සඳහා | 50 0 |

03-377/2

---

**මහරගම නගර සභාව**

ඉඩම් විකිණීම මත බදු අයකිරීම - 2013

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) අංක 165 ඇ(1) වගන්තිය යටතේ මහරගම නගර සභා බල සීමාව තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් යම් ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) ක් හෝ සමාන බද්දක් විකුණුම්කරු හෝ ඔහුගේ සේවකයා, අනුනියෝජිතයා විසින් ඉඩම විකිණීමෙන් ලත් මුදලින් මහරගම නගර සභාවට 2013.01.01 වැනි දින සිට ගෙවිය යුතු බව මහරගම නගර සභාවේ 2012.11.29 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක : 06(02) යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2012 ඔක්තෝබර් මස 10 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

03-377/8

## මහරගම නගර සභාව

### 2013 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු

1979 අංක 42 දරන මහ නගර සභා සහ නගර සභා (සංශෝධන) පනතේ සංශෝධිත (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 164(1)(2) හා 165අ(1)(2)(3) 165අඅ 165අ (1)(2)(3) වගන්ති ප්‍රකාර මහරගම නගර සභාව විසින් මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ ඇමුණුමේ උපලේඛන අංක 1, 2, 3, 4, 5, 6න් දක්වා ඇති පරිදි වෙළඳ බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු 2012.11.29 වැනි දිනැති අංක (6.1) දරන මහ සභා සම්මුතිය පරිදි මහරගම නගර සභාව විසින් 2013.01.01 වැනි දින සිට පනවා අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

2013 වර්ෂය සඳහා උපලේඛනයේ සඳහන් බදු හා බලපත්‍ර ගාස්තු 2013.03.31 වැනි දිනට පෙර ගෙවා අවසන් කළ යුතු බවත් නිවේදනය කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය 01

***2013 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තුව***

***ඇතැම් වෙළඳාම් සම්බන්ධයෙන් බලපත්‍ර***

| | *බලපත්‍රයේ ස්වභාවය* | *වාර්ෂික විටිනාකම රු. 750ට නොවැඩි රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත* |
|---|---|---|---|---|
| 01. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | බත් කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | භෝජන ශාලා හා ආහාර පාන විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | තානායම් | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | කිරි පිටි හා කිරි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | කරණවෑම් හා බාබර් සාප්පු | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | හරක් ගාල් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | තේ, කෝපි කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | අන්තරාදායක වූ ද අප්‍රිය වූ ද කර්මාන්ත | 500 0 | 750 0 | 1,000 0 |

ඉහත II හි අප්‍රිය වූ ද අන්තරාදායක වූ ද කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අප්‍රිය වූ හෝ අන්තරාදායක වූ ද කර්මාන්ත සඳහා පහත සඳහන් උපලේඛනය ආදේශ කරනු ලැබේ.

### උපලේඛනය 02

***අන්තරාදායක ව්‍යාපාර***

1. කබුක්, බොරළු හෝ කළුගල් කැනීම
2. කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම
3. සිසිල් බීම නිෂ්පාදනය
4. ග්‍රොස් එකකට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම
5. අයිස් නිෂ්පාදනය
6. යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්පාදනය
7. ගැලුම් 50ට වැඩි ප්‍රමානයක් පොල් තෙල් ගබඩා කර තබා ගැනීම
8. පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැළුම් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
9. ග්‍රොස් 10ට වැඩි ප්‍රමාණයක් ගිනි පෙට්ටි ගබඩා කර තබා ගැනීම හා ගිනි පෙට්ටි නිෂ්පාදනය කිරීම
10. ඉඹුල් පුළුන් හෝ කපු හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම
11. මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
12. ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම
13. තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
14. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
15. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
16. පිදුරු ගබඩා කර තබා ගැනීම
17. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම
18. කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම

19. ධාන්‍ය හෝ මාංෂ භෝග හොන්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
20. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම
21. යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
22. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
23. දර ගබඩාවක් පවත්වාගෙන යාම
24. හිරිගල් හෝ හුණුගල් සඳහා හැරීම
25. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම
26. අළුතින් ලී ඉරන ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
27. යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යාම
28. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොන්ඩර 15ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
29. හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම
30. බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම
31. අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
32. පොල් කටු ගබඩා කර තබා ගැනීම
33. ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොන්ඩර 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
34. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම
35. විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ට්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
36. අත් යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම
37. අත් යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම
38. සිල්ක් සහ කෘතිම රෙදි විවීම හා විසිතුරු කිරීම
39. මැසූ ඇඳුම් නිෂ්පාදනය
40. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
41. රිජිෆෝම් නිෂ්පාදනය කිරීම හෝ විකිණීම

**උපලේඛනය 03**

*අප්‍රසන්න ව්‍යාපාර*

1. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
2. පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
3. හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
4. හම් ගබඩා කර තබා ගැනීම
5. උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොන්ඩර 5ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම
6. කුකුලන් 100කට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම
7. බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම
8. රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
9. පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වාගෙන යාම
10. පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
11. තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම
12. කරවල, ලුණු මාළු හෝ ජාඩි හොන්ඩර 3ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
13. මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම
14. අඟුරු සඳහා හෝ පොල් කටු දැමීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම
15. සිමෙන්ති හොන්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
16. අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
17. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
18. සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යාම
19. පුන්නක්කු ටොන් 10ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
20. සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම
21. සතුන්ගේ මාංසවශේෂ හෝ ලේ පැස්සවීම
22. සබන් නිෂ්පාදනය කිරීම
23. සව් හෝ මඤ්ඤොක්කා කැටි (ටැපියෝකා) නිපදවීම
24. ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යාම
25. ට්‍රන්ක් පෙට්ටි සෑදීම හා සූට්කේස් නිපදවීම
26. අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම
27. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම
28. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
29. මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම
30. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
31. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම
32. සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම
33. රස කැවිලි වර්ග නිපදවීම
34. පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම
35. මේද නිපදවීම හෝ නිෂ්කර්ශනය කිරීම
36. දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම
37. දත් බුරුසු නිපදවීම
38. රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
39. විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
40. ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
41. හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම
42. පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
43. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර් 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
44. ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම
45. සෝඩා නිපදවීම
46. කෙඳි සායම් කිරීම
47. කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම
48. සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
49. පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින් වල ඇහිරීම
50. කෝපි, ධාන්‍ය වර්ග , මාංෂ භෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම
51. යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාංෂ භෝග කෙටීම
52. බේකින් පවුඩර් නිපදවීම
53. මාජරින් නිපදවීම
54. ගෑස් මැන්ටල් නිපදවීම
55. පොටි නිපදවීම
56. ඉටිපන්දම් නිපදවීම
57. කපුරු නිපදවීම
58. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
59. රෙදි සෝදන නිල් නිපදවීම
60. ලාකඩ නිපදවීම
61. සුවඳ පුයර නිපදවීම
62. පාසැල් රට හුණු නිපදවීම
63. ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
64. ටයර්,ටියුබ් වොල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
65. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් හා සිමෙන්ති භාණ්ඩ නිපදවීම

66. වැලි කඩදාසි නිපදවීම
67. ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම
68. පාසැල් ගල්ලැලි නිපදවීම
69. සෞඛ්‍ය තුවාකඩ නිපදවීම
70. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
71. සෙල්ලම් බඩු නිපදවීම
72. මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තැබීම
73. සීතකළ මස් හෝ මාළු ගබඩා කර තැබීම
74. කපාපු පොල් නිපදවීම
75. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
76. මැණික් ගල් කැපීම හා ඔප දැමීම
77. දිය හුණු සුද (වයිටින්) හුණු හෝ හිරිගල් නිපදවීම
78. එනසාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම
79. පපඩම් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීම

## උපලේඛනය 04

*අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර*

1. තලාතු මිණිරන් ශුද්ධ කිරීම
2. රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු (කරදමුංගු එනසාල් හෝ කෙඳි) වර්ග සකස් කිරීම
3. ඩ්‍රයි ක්ලීන් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම
4. රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම
5. විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
6. තෙල් හෝ සත්ව මේද පැසවීම
7. හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම, මැටි බඳුන් ඔප දැමීම
8. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
9. මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
10. හොණ්ඩර 3ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම
11. බැටරි චාර්ජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම
12. වැල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
13. මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම
14. බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
15. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම
16. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
17. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
18. ගල් ස්මාරක නිපදවීම
19. පැට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
20. පැට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
21. මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යාම
22. පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම
23. කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
24. විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම
25. මදුරු කව (කොයිල්ස්) නිපදවීම
26. ලී දඬු, ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම
27. රබර ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම
28. ගල් තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම
29. වීදුරු භාණ්ඩ නිපදවීම
30. වීදුරු කැඩපත් නිපදවීම
31. යකඩ තහඩු ගැල්වනයිස් කිරීම
32. පාස්සන ඊයම් නිපදවීම
33. කුළු බඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34. වානේ භාණ්ඩ නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම
35. පොලිතීන් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
36. පොලිතීන් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

## උපලේඛනය 05

*2013 වර්ෂය සඳහා ව්‍යාපාර බදු*

